ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මානක තැන කේ. බාලසුන්දරම් යන අය විසින් සාදන ලද අංක 53/1971 දරන පිඹුරේ ලොට් 14, නැගෙනහිරට : බලයලත් මානක තැන කේ. බාලසුන්දරම් යන අය විසින් සාදන ලද අංක 53/1971 දරන පිඹුරේ ලොට් 25, දකුණට : මෙම ඉඩමේ ලොට් 15A1 කොටසක් සහ බස්නාහිරට : ජෝජ් ආර් ද සිල්වා මාවත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දෙකයි දශම හයයි දෙකයි බිංදුවක් (පර්. 2.620) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 971/15A දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව 1058/178 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 1727 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

3. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කැලණිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ සියනෑ කෝරළේ, බටහිර අදිකාරි පත්තුවේ, කැලණිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කැලණිය 264 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කැලණිය ග්‍රාමයේ පිහිටි බියගම පාර, වරිපනම් අංක 1304 දරන "දොඹගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩොනල්ඩ් හේවාමනගේ යන අය විසින් සාදන ලද 2001 මැයි 26 දාතම හා අංක 1891 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ඇති ලොට් 2A වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : බියගම පාර, නැගෙනහිරට : දැනට එමිල්ඩා පෙරේරාගේ අංක 1306 දරන පරිශ්‍රයන්, දකුණට : මෙම ඉඩමේ ලොට් 2B සහ බස්නාහිරට : මෙහි ලොට් 1A යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම හතයි බිංදුවක් (පර්. 20.70) හෝ හෙක්ටයාර 0.05236ක් විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 1891 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව G 130/97 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 1729 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

02 - 823/5

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එම්. පී. කේ. සේනාරත්න
ගිණුම් අංකය : 0051 5000 5290

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023.12.14 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. එස්. කල්හාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2018.04.02 දින හා අංක 3228 දරන, 2022.10.21 දින හා අංක 5875 සහ 2022.12.23 දින හා අංක 5988 දරන උකස් බැඳුම්කර සියල්ල මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මොහාන් ප්‍රදීප් කුමාර සේනාරත්න බන්ධනදායී වශයෙන් හා බට්ටගොඩගේ රේණුකා දමයන්ති උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 3228, 5875 සහ 5988 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දෙකෝටි හය ලක්ෂ අනූ තුන් දහස් එකසිය විසි තුනයි ශත හතළිස් තුනක (රු. 20,693,123.43) මුදලක්, 2023.11.08 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දෙකෝටි හය ලක්ෂ අනූ තුන් දහස් එකසිය විසි තුනයි ශත හතළිස් තුනක (රු. 20,693,123.43) මුදල ද, 2023.11.09 දින සිට අංක 3228, 5875 සහ 5988 දරන එකී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අට ලක්ෂ අසූ පන් දහස් අටසිය තිස් පහයි ශත හැට හතක (රු. 885,835.67) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) හා තවත් රුපියල් හැත්තෑ හතර ලක්ෂ පහළොස් දහසක (රු. 7,415,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහක් (15.5%) හා තවත් රුපියල් නම ලක්ෂ අසූ හත් දහස් තුන්සිය විස්සක (රු. 987,320.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහක් (15.5%) හා තවත් රුපියල් දහ නම ලක්ෂ අසූ හය දහස් තුන්සිය තිස් පහයි ශත අසූ දෙකක (රු. 1,986,335.82) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහක් (15.5%) හා තවත් රුපියල් හැත්තෑ හය ලක්ෂ හැට තුන් දහස් නමසිය තිස් තුනයි ශත අනූ පහක (රු. 7,663,933.95) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබීඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 3228, 5875 සහ 5988 දරන උකස් බැඳුම්කර මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති

මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන එන්. යූ. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, උඩුනුවර කඳුපලාත, උඩුනුවර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ වට්ටප්පල, අංක 123 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වට්ටප්පල පිහිටි "බූවැලිකඩහේන *නොහොත්* මදටියගහමුලවත්ත සහ උඩගෙදර වත්ත" යයි කියනු ලබන ඉඩමට (බලයලත් මානක තැන ජේ. එස්. සී. කේ. මිස්සෝ යන අය විසින් සාදන ලද 1938 සැප්තැම්බර් 24 දාතම හා අංක 912 දරන පිඹුරේ නිරූපිත ලොට් 01, 02 සහ 03 යන සියල්ල හි නැවත මිනුමක් වන) බලයලත් මානක තැන පී. ඉන්ද්‍රානි මල්ලිකා යන අය විසින් සාදන ලද 2015 ජුනි 09 දාතම හා අංක 2303 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ඇති ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට: ටී. බී. වරකඋල්ල විසින් හිමිකම් කියන කපුකොටුවේහේන සහ අංක 912 දරන පිඹුරේ ලොට් 0-4, නැගෙනහිරට : එච්. එම්. පුංචිබන්ඩා විසින් හිමිකම් කියන කපුකොටුවේහේන, අංක 912 දරන පිඹුරේ ලොට් 04 සහ ඇළ, දකුණට : ඇළ සහ පාර සහ බස්නාහිරට : ටී. බී. වරකඋල්ල විසින් හිමිකම් කියන කපුකොටුවේහේන යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් තුනක් (අ.2, රූ.3) හෝ හෙක්ටයාර 1.1129ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව C524/148 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

02 - 823/4

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

නිල්දිය මංකඩ සෆාරි ලොජ් (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංකය : 5142 3100 0066/ 5142 3100 0384

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023.12.14 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. ආර්. උදයංග යන අය විසින් ලියා සහතික කරන ලද 2018.04.09 දින හා අංක 321 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලියාපදිංචි අංක PV 117363 දරන ශ්‍රී ලංකා සමාගම් නීතින් යටතේ නිසිලෙස සංස්ථා ගතකොට ඇති සමාගමක් වන නිල්දිය මංකඩ සෆාරි ලොජ් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුසන්ත පුෂ්පකුමාර පල්ලියගුරු උකස්කරු වශයෙන් පැහැර ඇති හෙයින් ද, එකී අංක 321 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ඇමෙරිකා එක්සත් ජනපද වලංගු මුදලින් එක්සත් ජනපද ඩොලර් තුන් ලක්ෂ අට දහස් හැට නමයයි ශත හැට හතක (USD 308,069.67) මුදලක් 2023.11.16 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී ඇමෙරිකා එක්සත් ජනපද වලංගු මුදලින් එක්සත් ජනපද ඩොලර් තුන් ලක්ෂ අට දහස් හැට නමයයි ශත හැට හතක (USD 308,069.67) මුදල ද, 2023.11.17 දින සිට අංක 321 උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, එක්සත් ජනපද ඩොලර් දෙලක්ෂ හැත්තෑ හත් දහස් නමසිය හතළිස් පහයි ශත අසූ තුනක (USD 277,945.83) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහක් (12%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබීඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 321 දරන උකස් බැඳුම්කරය මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, ගොඩිගමුව උතුර, අංක 32 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ බොරලැස්ගමුව, කටුවාවල පාර පිහිටි කටුවාවල පාර, වරිපනම් අංක 8/1A දරන "දෙල්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ජී. ජී. පියසේන යන අය විසින් සාදන ලද 2007 ජුනි 18 දාතම හා අංක 1601 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 1286 දරන පිඹුරේ ලොට් B4B හි ඉතිරි කොටස, නැගෙනහිරට : අංක 1286 දරන පිඹුරේ ලොට් B4C, දකුණට: පාර (අංක 1286 දරන පිඹුරේ ලොට් B6) සහ බස්නාහිරට: අංක 1570 දරන පිඹුරේ ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් නමයයි දශම පහයි තුනක් (පර්. 9.53) විශාල ඉඩම් කොටස සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1601 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව B 391/62 යටතේ දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, ගොඩිගමුව උතුර, අංක 32 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ බොරලැස්ගමුව, කටුවාවල පාර පිහිටි කටුවාවල පාර, වරිපනම් අංක 8/2 දරන "දෙල්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. ඩී. එම්. ජේ. රූපසිංහ යන අය විසින් සාදන ලද 2008 ජූලි 19 දාතම හා අංක 3292 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 1286 දරන පිඹුරේ ලොට් B4B හි ඉතිරි කොටස, නැගෙනහිරට : අංක 1570 දරන පිඹුරේ ලොට් 2, දකුණට : පාර (අංක 1286 දරන පිඹුරේ ලොට් B6) සහ බස්නාහිරට : අංක 1286 දරන පිඹුරෙ ලොට් B4A යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (පර්. 10) විශාල ඉඩම් කොටස සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 3292 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව M 3301/148 යටතේ දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී 3292 සහ 1601 දරන පිඹුරේ ලොට් B6 දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද ඒ හා බැඳුණ වෙනත් අයිතීන් ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

02 - 822

### නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතය

2023 මාර්තු මස 21 වැනි දින පවත්වන ලද නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත සඳහන් යෝජනා සම්මතය විශේෂයෙන්ම සහ ඒකමතිකව සම්මත කරන ලදී; එනම්,

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය (බැංකුව) වෙනුවෙන් ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් බිමාලි කේ. සූරියාරච්චි විසින් සහතික කරන ලද 2015.05.28 දින අංක 1315 දරන උකස් බැඳුම්කරය, 2015.05.28 දින අංක 1317 දරන උකස් බැඳුම්කරය, 2015.05.28 දින අංක 1318 දරන උකස් බැඳුම්කරය, 2015.05.28 දින අංක 1320 දරන උකස් බැඳුම්කරය, 2016.01.19 දින අංක 1400 දරන උකස් බැඳුම්කරය, 2016.01.19 දින අංක 1402 දරන උකස් බැඳුම්කරය, 2016.09.22 දින අංක 1505 දරන උකස් බැඳුම්කරය, 2016.09.22 දින අංක 1507 දරන උකස් බැඳුම්කරය මගින් සහ ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් එච්. කේ. ඒ. එම්. කුමාරි විසින් සහතික කරන ලද 2018.05.10 දින අංක 502 දරන උකස් බැඳුම්කරය, 2020.08.31 දින අංක 747 දරන උකස් බැඳුම්කරය, 2020.08.31 දින අංක 749 දරන උකස් බැඳුම්කරය, 2020.08.31 දින අංක 751 දරන උකස් බැඳුම්කරය සහ 2021.08.27 දින අංක 940 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කර පවරා දී ඇති සහ මෙහි උපලේඛනවල සවිස්තරාත්මකව විස්තර කර ඇති දේපළ, පරිශ්‍රය, යන්ත්‍රෝපකරණ සහ උපකරණ ඇපයට තබා එයට එරෙහිව ප්‍රදානය කරන ලද ණය මුදල්/ පහසුකම් මත අයවිය යුතු මුදල් ගෙවීම (පළමුවන ණය ගැණුම්කරු වන) මාලඹේ පදිංචි ලොකුගමගේ සුහිත් උදයභද්‍ර කරුණාතිලක යන අය, (දෙවන ණය ගැනුම්කරු වන) මාලඹේ පදිංචි කමලාංගනී සුනේත්‍රා විජේසුන්දර කරුණාතිලක යන අය, (තුන්වන ණය ගැනුම්කරු වන) පෝද්දල පදිංචි ලොකුගමගේ කුෂාන් සංජීව කරුණාතිලක යන අය සහ (හතරවන ණය ගැනුම්කරු වන) ලොකුගමගේ රනුල් මින්දුල කරුණාතිලක යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද;

පහත පළමුවන උපලේඛනයේ විස්තර කර ඇති දේපළෙහි සහ පරිශ්‍රයෙහි සින්නක්කර අයිතිකරු වන පළමුවන ණය ගැනුම්කරු විසින් ඉහත කී අංක 1315, 1318, 1400, 1505, 502 සහ 747 දරන උකස් බැඳුම්කර යටතේ ඔහුගේ සින්නක්කර අයිතිය, හිමිකම සහ සම්බන්ධතාව බැංකුව වෙත උකස්කර ඇති හෙයින් ද;

පහත දෙවන උපලේඛනයේ විස්තර කර ඇති දේපළෙහි සහ පරිශ්‍රයෙහි සින්නක්කර අයිතිකරු වන පළමුවන ණය

ගැනුම්කරු සහ තුන්වන ණය ගැනුම්කරු විසින් ඉහත කී අංක 1315, 1318, 1400, 1505, 502, 749 සහ 940 දරන උකස් බැඳුම්කර යටතේ ස්වකීය සින්නක්කර අයිතිය, හිමිකම සහ සම්බන්ධතාව බැංකුව වෙත උකස්කර ඇති හෙයින් ද;

පහත තුන්වන උපලේඛනයේ විස්තර කර ඇති දේපළෙහි සහ පරිශ්‍රයෙහි සින්නක්කර අයිතිකරු වන පළමුවන ණය ගැනුම්කරු විසින් ඉහත කී අංක 751 දරන උකස් බැඳුම්කරය යටතේ ඔහුගේ සින්නක්කර අයිතිය, හිමිකම සහ සම්බන්ධතාව බැංකුව වෙත උකස්කර ඇති හෙයින් ද;

පහත හතරවන උපලේඛනයේ විස්තර කර ඇති යන්ත්‍රාගාර, යන්ත්‍රෝපකරණ සහ උපකරණවල සින්නක්කර අයිතිකරු වන පළමුවන ණය ගැනුම්කරු විසින් ඉහත කී අංක 1317, 1320, 1402 සහ 1507 දරන උකස් බැඳුම්කර යටතේ ඔහුගේ සින්නක්කර අයිතිය, හිමිකම සහ සම්බන්ධතාව බැංකුව වෙත උකස්කර ඇති හෙයින් ද;

2022 දෙසැම්බර් මස 31 වැනි දිනය වන විට බැංකුව වෙත ඉහත කී අංක 1315, 1318, 1400, 1505, 502, 747, 1315, 1318, 1400, 1505, 749, 751, 940, 1317, 1320, 1402 සහ 1507 දරන උකස් බැඳුම්කර මත රුපියල් මිලියන තිස්පහයි අටලක්ෂ හැටහතර දහස් නවසිය දෙකයි ශත හතරක් වූ (රු. 35,864,902.04) මුදලක් ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින හෙයින් ද;

අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර ඇත්නම්) එම ගෙවීම අඩු කිරීමෙන් පසුව ප්‍රධාන පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව දරන ලද ප්‍රචාරක පිරිවැය, විකුණුම් පිරිවැය සහ වෙනත් ගාස්තු ද සමග ඉහත කී රුපියල් මිලියන තිස්පහයි අටලක්ෂ හැටහතර දහස් නවසිය දෙකයි ශත හතරක් වූ (රු. 35,864,902.04) මුදල හෝ දේපළ වෙන්දේසිය සිදු කිරීමේ අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව පවතින එහි යම් කොටසක් සහ 2023 ජනවාරි මස 01 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් ඉහත කී අංක 1315, 1318, 1400, 1505, 502, 747, 1315, 1318, 1400, 1505, 749, 751, 940, 1317, 1320, 1402 සහ 1507 දරන උකස් බැඳුම්කර සම්බන්ධයෙන් වන විට වර්ෂයකට සියයට පහළොවයි දශම පහයි බිංදුවක් වූ (15.5%) අනුපාතිකය යටතේ ඉහත කී බැඳුම්කර මත අයවිය යුතු රුපියල් මිලියන විසිනවයයි හයලක්ෂ එක්දහස් අටසිය හතයි ශත පනස් හතක් වූ (රු. 29,601,807.57) මූලික මුදල මත වූ පොළිය අයකර ගැනීම සඳහා එකී උකස් බැඳුම්කර මගින් එකී ණය මුදල්/ පහසුකම් සඳහා ඇපකරයක් වශයෙන් බැංකුව වෙත උකස් කරන ලද පහත විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය, යන්ත්‍රාගාර, යන්ත්‍රෝපකරණ සහ උපකරණවල සින්නක්කර සහ වෙනත් අයිතිවාසිකමක්, හිමිකමක් සහ සම්බන්ධතාවක් ඇතුළුව එම දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (ප්‍රධාන පනත) යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාව ඇතුළත, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත, හෝකන්දර - 477 ග්‍රාම නිලධාරි කොට්ඨාසය (අංක 6 කොට්ඨාසය) ඇතුළත පිටත වැව පාර, තලංගම උතුර පිහිටා ඇත්තා වූ ද, අංක 472/76, හෝකන්දර පාර යන වරිපනම් අංකය දරන්නා වූ ද, "කැකුණගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමේ ලොට් අංක 25 හි ලොට් 25 බී හි නැවත මැනීමක් වන්නා වූ ද, බලයලත් මිනින්දෝරු කේ. එන් ඒ. අල්විස් විසින් සාදන ලද 2006.09.22 දින අංක 2402 දරන පිඹුරේ ලොට් ඒ ලෙස ලකුණුකර නිරූපණය කර ඇත්තා වූ ද,

*උතුරට* : අංක 37/96 දරන පිඹුරේ ලොට් 25ඒ සහ අංක 2725 දරන පිඹුරේ ලොට් අංක 15;

*නැගෙනහිරට* : අංක 2725 දරන පිඹුරේ ලොට් අංක 15, 14 සහ 26;

*දකුණට* : අංක 2725 දරන පිඹුරේ ලොට් අංක 26 සහ ලොට් අංක 41 (මාර්ගයේ රක්ෂිතය);

*බටහිරට* : අංක 2725 දරන පිඹුරේ ලොට් අංක 41 (මාර්ගයේ රක්ෂිතය) සහ අංක 37/96 දරන පිඹුරේ ලොට් 25 ඒ.

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, අංක 2402 දරන පිඹුරට අනුව මේ මායිම් තුළ ප්‍රමාණයෙන් පර්චස් දොළහක් වූ (පර්. 12) බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ පස, ගහකොළ, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද සමග වේ.

ඉහත ඉඩම පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමක් වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාව ඇතුළත, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත, හෝකන්දර - 477 ග්‍රාම නිලධාරි කොට්ඨාසය (අංක 6 කොට්ඨාසය) ඇතුළත පිටත වැව පාර, තලංගම උතුර පිහිටා ඇත්තා වූ ද, අංක 472/76, හෝකන්දර පාර යන වරිපනම් අංකය දරන්නා වූ ද, "කැකුණගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමේ ලොට් අංක 25 සඳහා බලයලත් මිනින්දෝරු එම්. සී. එල්. සී. පෙරේරා විසින් සාදන ලද 1996.08.19 දින අංක

37/96 දරන පිඹුරේ ලොට් 25 බී ලෙස ලකුණුකර නිරූපණය කර ඇත්තා වූ ද,

*උතුරට* : ඉහත කී අංක 2725 දරන පිඹුරේ ලොට් අංක 14 සහ ලොට් අංක 15;

*නැගෙනහිරට* : අංක 2725 දරන පිඹුරේ ලොට් අංක 26;

*දකුණට* : අංක 2725 දරන පිඹුරේ ලොට් අංක 41 (මාර්ගයේ රක්ෂිතය);

*බටහිරට* : මෙහි ලොට් 25 ඒ.

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, අංක 37/96 දරන පිඹුරට අනුව මේ මායිම් තුළ ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම එකයි දෙකක් වූ (පර්. 12.12) බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ පස, ගහකොළ, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද සමග වේ.

ඉහත ඉඩම පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමක් වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාව ඇතුළත, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත, හෝකන්දර - 477 ග්‍රාම නිලධාරි කොට්ඨාසය (අංක 6 කොට්ඨාසය) ඇතුළත පිටත වැව පාර, තලංගම උතුර පිහිටා ඇත්තා වූ ද, අංක 472/76, හෝකන්දර පාර යන වරිපනම් අංකය දරන්නා වූ ද, "කැකුණගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමේ ලොට් අංක 25 සඳහා බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. අහංගම විසින් සාදන ලද 1994.03.05 දින අංක 3558 දරන පිඹුරේ ලොට් 25බී ලෙස ලකුණුකර නිරූපණය කර ඇත්තා වූ ද,

*උතුරට* : මෙහි ලොට් 25 ඒ;

*නැගෙනහිරට* : අංක 2725 දරන පිඹුරේ ලොට් අංක 15 සහ ලොට් අංක 14;

*දකුණට* : අංක 2725 දරන පිඹුරේ ලොට් අංක 26;

*බටහිරට* : අංක 2725 දරන පිඹුරේ ලොට් අංක 41 (මාර්ගයේ රක්ෂිතය).

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, අංක 3558 දරන පිඹුරට අනුව මේ මායිම් තුළ ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම එකයි තුනක් වූ (පර්. 12.13) බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ පස, ගහකොළ, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද සමග වේ. ඉහත කී ඉඩම් කොටස හෝමාගම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ බී 896/102 දරන වෙලුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

තව ද, පහත දැක්වෙන ඉඩම් මත යාමේ අයිතිය ද සමග වේ :-

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාව ඇතුළත කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත, හෝකන්දර - 477 ග්‍රාම නිලධාරි කොට්ඨාසය (අංක 6 කොට්ඨාසය) ඇතුළත පිටත වැව පාර, තලංගම උතුර පිහිටි "කැකුණගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩී. එල්. පීරිස් විසින් සාදන ලද 1975.05.21 දින අංක 2725 දරන පිඹුරේ ලොට් අංක 36 ලෙස ලකුණුකර නිරූපණය කර ඇත්තා වූ ද,

*උතුරට* : එකී ඉඩමේම ලොට් සී සහ පොදු මාර්ගය;
*නැගෙනහිරට* : මෙහි ලොට් අංක 7;
*දකුණට* : මෙහි ලොට් අංක 37;
*බටහිරට* : මෙහි ලොට් අංක 6.

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, අංක 2725 දරන පිඹුරට අනුව මේ මායිම් තුළ ප්‍රමාණයෙන් පර්චස් විසිහතරයි දශම දෙකයි පහක් වූ (පර්. 24.25) බෙදා වෙන්කළ ඉඩම් කොටස වේ. ඉහත කී ඉඩම් කොටස හෝමාගම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ බී 404/70 දරන වෙලුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාව ඇතුළත කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත, හෝකන්දර - 477 ග්‍රාම නිලධාරි කොට්ඨාසය (අංක 6 කොට්ඨාසය) ඇතුළත පිටත වැව පාර, තලංගම උතුර පිහිටි "කැකුණගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩී. එල්. පීරිස් විසින් සාදන ලද 1975.05.21 දින අංක 2725 දරන පිඹුරේ ලොට් අංක 37 ලෙස ලකුණුකර නිරූපණය කර ඇත්තා වූ ද,

*උතුරට* : මෙහි ලොට් අංක 1, 2, 35, 3, 4, 5, 6, 36 සහ 7;
*නැගෙනහිරට* : එකී ඉඩමේම ලොට් එම්;
*දකුණට* : මෙහි ලොට් අංක 38, 8, 13, 39, 14, 15, 16, 17 සහ 40;
*බටහිරට* : මෙහි ලොට් අංක 18.

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, අංක 2725 දරන පිඹුරට අනුව මේ මායිම් තුළ ප්‍රමාණයෙන් පර්චස් තිස්පහයි දශම දෙකයි පහක් වූ (පර්. 35.25) බෙදා වෙන්කළ ඉඩම් කොටස වේ. ඉහත කී ඉඩම් කොටස හෝමාගම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ බී 404/71 දරන වෙලුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාව ඇතුළත කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත, හෝකන්දර - 477 ග්‍රාම නිලධාරි කොට්ඨාසය (අංක 6 කොට්ඨාසය) ඇතුළත පිටත වැව පාර, තලංගම උතුර පිහිටි "කැකුණගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩී. එල්. පීරිස් විසින් සාදන ලද 1975.05.21 දින අංක 2725 දරන පිඹුරේ ලොට් අංක 39 ලෙස ලකුණුකර නිරූපණය කර ඇත්තා වූ ද,

*උතුරට* : මෙහි ලොට් අංක 37;
*නැගෙනහිරට* : මෙහි ලොට් අංක 13, 12 සහ 11;
*දකුණට* : මෙහි ලොට් අංක 42;
*බටහිරට* : මෙහි ලොට් අංක 34, 27, 41, 26 සහ 14.

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, අංක 2725 දරන පිඹුරට අනුව මේ මායිම් තුළ ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම නවයයි බිංදුවක් වූ (පර්. 20.90) බෙදා වෙන්කළ ඉඩම් කොටස වේ. ඉහත කී ඉඩම් කොටස හෝමාගම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ බී 896/104 දරන වෙලුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

4. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාව ඇතුළත කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත, හෝකන්දර - 477 ග්‍රාම නිලධාරි කොට්ඨාසය (අංක 6 කොට්ඨාසය) ඇතුළත පිටත වැව පාර, තලංගම උතුර පිහිටි "කැකුණගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩී. එල්. පීරිස් විසින් සාදන ලද 1975.05.21 දින අංක 2725 දරන පිඹුරේ ලොට් අංක 41 ලෙස ලකුණුකර නිරූපණය කර ඇත්තා වූ ද,

*උතුරට* : මෙහි ලොට් අංක 23, 24, 25 සහ 26;
*නැගෙනහිරට* : මෙහි ලොට් අංක 39;
*දකුණට* : මෙහි ලොට් අංක 27, 28, 29 සහ 30;
*බටහිරට* : මෙහි ලොට් අංක 40.

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, අංක 2725 දරන පිඹුරට අනුව මේ මායිම් තුළ ප්‍රමාණයෙන් පර්චස් විසිපහයි දශම දෙකයි පහක් වූ (පර්. 25.25) බෙදා වෙන්කළ ඉඩම් කොටස වේ. ඉහත කී ඉඩම් කොටස හෝමාගම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ බී 896/103 දරන වෙලුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තොට වලල්ලාවිට කෝරළේ, නියාගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත, නියාගම - 38 ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත නියාගම පිහිටි "ලබුවැල්තැන්න *හෙවත්* උඩුගමවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු එම්. පී. ආර්. ආනන්ද විසින් සාදන ලද 2007.10.07 දින අංක 1870 දරන පිඹුරේ ලොට් ඒ ලෙස ලකුණුකර නිරූපණය කර ඇත්තා වූ දෑ:-

*උතුරට* : අංක 240 ඒ දරන පිඹුරේ ලොට් 5ඒ හි කොටස;

*නැගෙනහිරට* : ගල්ළිඳවත්ත (අර්ස්කින් මහතා විසින් හිමිකම් පානු ලබන);

*දකුණට* : අංක 240ඒ දරන පිඹුරේ ඉතිරි ලොට් 6ඒ;

*බටහිරට* : ප්‍රධාන මාර්ගය.

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් දශම පහයි බිංදුවක් වූ (රූ.2, පර්. 0.50) බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද "ගුරුකන්ද තේ කර්මාන්තශාලාව" යනුවෙන් හඳුන්වනු ලබන පරිශ්‍රය ද සමග වේ.

ඉහත ඉඩම පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමක් වේ:-

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තොට වලල්ලාවිට කෝරළේ, නියාගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත, නියාගම - 38 ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත නියාගම පිහිටි "ලබුවැල්තැන්න *හෙවත්* උඩුගමවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු වී. එල්. ඩී. ඒ. අබේගුණවර්ධන විසින් සාදන ලද 1977.09.08 දින අංක 240 ඒ දරන පිඹුරේ ලොට් 5 ඒ ලෙස ලකුණුකර නිරූපණය කර ඇත්තා වූ දෑ:-

*උතුරට* : එකී ඉඩමේම ලොට් 4 ඒ;

*නැගෙනහිරට* : ගල්ළිඳවත්ත (අර්ස්කින් මහතා විසින් හිමිකම් පානු ලබන);

*දකුණට* : එකී ඉඩමේම ලොට් 6 ඒ;

*බටහිරට* : අම්බලන්ගොඩ සිට නියාගම දක්වා වන මාර්ගය.

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් දහයක් වූ (රූ.2, පර්. 10) බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද "ගුරුකන්ද තේ කර්මාන්තශාලාව"

යනුවෙන් හඳුන්වනු ලබන පරිශ්‍රය ද සමග වේ. ඉහත කී ඉඩම් කොටස බලපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ බී 222/221 දරන වෙලුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

### තුන්වන උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තොට වලල්ලාවිට කෝරළේ, නියාගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත, නියාගම - 38 ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත නියාගම පිහිටි "ලබුවැල්තැන්න හෙවත් උඩුගමවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු එච්. එල්. ඒ. එම්. හිෂාම් විසින් සාදන ලද 2020.07.19 දින අංක 5940 දරන පිඹුරේ ලොට් 7 ඒ 1 ලෙස ලකුණුකර නිරූපණය කර ඇත්තා වූ දෑ:-

*උතුරට* : වී. එල්. ඩී. අබේගුණවර්ධන විසින් සාදන ලද අංක 240ඒ දරන පිඹුරේ ලොට් 6 ඒ සහ ගල්ළිඳවත්ත;

*නැගෙනහිරට* : ගල්ළිඳවත්ත සහ වී. එල්. ඩී. අබේගුණවර්ධන විසින් සාදන ලද අංක 240 ඒ දරන පිඹුරේ ලොට් 8 ඒ;

*දකුණට* : වී. එල්. ඩී. අබේගුණවර්ධන විසින් සාදන ලද අංක 240 ඒ දරන පිඹුරේ ලොට් 8 ඒ;

*බටහිරට* : මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය).

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ඉහත කී අංක 5940 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් රූඩ් එකක් වූ (රූ.1) බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ සමග වේ. ඉහත කී ඉඩම් කොටස ඇල්පිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ බී 222/221 දරන වෙලුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

### හතරවන උපලේඛනය

ඇල්පිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත නියාගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත නියාගම - 38 ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත තල්ගස්වල ගුරුකන්දවත්ත "ගුරුකන්ද තේ කර්මාන්තශාලා" පරිශ්‍රයේ තබා ඇත්තා වූ හෝ ගබඩා කර ඇත්තා වූ හෝ සම්බන්ධ කර ඇත්තා වූ හෝ සවිකර ඇත්තා වූ ද, ව්‍යාපෘතිය සඳහා හෝ සම්බන්ධයෙන් මිලදී ගනු ලබන්නා වූ ද, එක්ව හා වෙන් වෙන් වශයෙන් වූ යන්ත්‍රාගාර, යන්ත්‍රෝපකරණ උපකරණ සවිතුරු සහ සවිකිරීම් වේ.

**I වන කොටස**

| *යන්ත්‍රෝපකරණ/ යන්ත්‍රාගාරය පිළිබඳ විස්තරය* | *වර්ගය සහ මාදිලිය* | *නිෂ්පාදිත වර්ෂය* |
|---|---|---|
| "එනිසෝර්ට්" තේවල වර්ණය වෙන් කරන උපකරණය | "එනිසෝර්ට්" ඉන්ටෙලිජන්ස් ඩීසීඑස් 4004 | 2016 |

**I වන කොටස**

| *යන්ත්‍රෝපකරණ/ යන්ත්‍රාගාරය පිළිබඳ විස්තරය* | *වර්ගය සහ මාදිලිය* | *නිෂ්පාදිත වර්ෂය* |
|---|---|---|
| 72', අශ්වබල 7.5 ට්‍රෆ් | 1995 | |
| 72', අශ්වබල 7.5 ට්‍රෆ් | 1995 | |
| 72', අශ්වබල 5 ට්‍රෆ් | 2000 | |
| 72', අශ්වබල 5 ට්‍රෆ් | 2000 | |
| තේ රෝලරය (44" සීසීසී) | 2001 | 11650 |
| තේ රෝලරය (36" වෝකර්) | 1990 | 2275 |
| තේ රෝලරය (36" මාර්ෂල්) | 1995 | 8595E |
| තේ රෝලරය (45.5" වෝකර්) | 2009 | |
| රෝලර් බ්‍රේකරය 10" 3" | 2009 | |
| රෝලර් බ්‍රේකරය 10" 3" | 1990 | |
| වියළන උපකරණය (ඩ්‍රයර්) "සිරිකෝ" | 2005 | 2744 |
| නටුහරුව (31") | 1995 | |
| මිඩ්ල්ටන් ශිෆ්ටරය | 2010 | |
| චෝටා ශිෆ්ටරය | 200 | |
| මිච් ශිෆ්ටරය | 2011 | |
| මිච් ශිෆ්ටරය | 2005 | |
| මිච් ශිෆ්ටරය | 1990 | |
| මිච් ශිෆ්ටරය | 1990 | |
| මිච් ශිෆ්ටරය | 1990 | |
| කුල්ල | 1995 | |
| කෙඳි සහිත පැදුර | 2005 | |
| 7500 C සෙන්චික් වර්ණ වෙන්කරන උපකරණය | 1997 | 92327 |
| 8300 C සෙන්චික් වර්ණ වෙන්කරන උපකරණය | 2013 | 92345 |
| මොනෝරේල් | 2000 | |

| *යන්ත්‍රෝපකරණ/ යන්ත්‍රාගාරය පිළිබඳ විස්තරය* | *වර්ගය සහ මාදිලිය* | *නිෂ්පාදිත වර්ෂය* |
|---|---|---|
| ලීෆ් එලිවේටරය | 2000 | |
| කිරන තරාදිය | 2014 | |
| කිරන තරාදිය | 2012 | |
| විදුලි ජනන යන්ත්‍රය | 2005 | |
| තේ කැපුම් උපකරණය (ටී කටර්) | 2013 | |
| හියුමැනිටි ගිනි නිවාරණ ඒකකය | 2013 | |
| සීසීආර් කැමරා පද්ධතිය (ඒකක 16) | 2014 | |

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

02 - 820

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතය

2023 අප්‍රේල් මස 18 වැනි දින පවත්වන ලද නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනා සම්මතය විශේෂයෙන් ම සහ ඒකමතිකව සම්මත කරන ලදී;

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) ආයතනය වෙනුවෙන් මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එන්. සී. නීරූජා විසින් සහතික කරන ලද 2020.03.04 දින අංක 1533 දරන උකස් බැඳුම්කරය මගින් සහ 2019.07.19 දින අංක 1305 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කර පවරා දෙන ලද මෙහි උපලේඛනයේ 1 වන අයිතමයේ සහ 2 වන අයිතමයේ සවිස්තරාත්මකව විස්තරකර ඇති දේපළ සහ පරිශ්‍රය ඇපයට තබා එයට එරෙහිව ප්‍රදානය කරන ලද ණය මුදල්/පහසුකම් මත අයවිය යුතු මුදල් ගෙවීම ("පළමුවන ණයගැනුම්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) මඩකලපුවේ පදිංචි අබ්දුල් නසීර් මොහොමඩ් ඉක්රාම් යන අය විසින් සහ ("දෙවන ණයගැනුම්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) මඩකලපුවේ පදිංචි ජලාල්දීන් මොහොමඩ් රියාස් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

පහත 1 වන අයිතමයේ විස්තර කර ඇති දේපළෙහි සහ පරිශ්‍රයෙහි සින්නක්කර අයිතිකරු වන පළමු ණයගැනුම්කරු විසින් ස්වකීය සින්නක්කර අයිතිය, හිමිකම සහ සම්බන්ධතාවය ඉහත කී අංක 1533 දරන උකස් බැඳුම්කරය යටතේ බැංකුව වෙත උකස් කර ඇති හෙයින් ද,

පහත 2 වන අයිතමයේ විස්තර කර ඇති දේපළෙහි සහ පරිශ්‍රයෙහි සින්නක්කර අයිතිකරු වන දෙවන ණයගැනුම්කරු විසින් ස්වකීය සින්නක්කර අයිතිය, හිමිකම සහ සම්බන්ධතාවය ඉහත කී අංක 1305 දරන උකස් බැඳුම්කරය යටතේ බැංකුව වෙත උකස්කර ඇති හෙයින් ද,

2023 පෙබරවාරි මස 28 දිනය වන විට බැංකුව වෙත ඉහත කී අංක. 1533 සහ අංක 1305 දරන උකස් බැඳුම්කර මත රුපියල් මිලියන හයයි තුන්ලක්ෂ තිස්හතර දහස් අටසිය හැත්තෑ තුනයි ශත අනූ හතක් වූ මුදලක් (රු. 6,334,873.97) ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින හෙයින් ද,

අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර ඇත්නම්) එම ගෙවීම අඩු කිරීමෙන් පසුව, ප්‍රධාන පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව දරන ලද ප්‍රචාරක පිරිවැය, විකුණුම් පිරිවැය සහ වෙනත් ගාස්තු ද සමග ඉහත කී රුපියල් මිලියන හයයි තුන්ලක්ෂ තිස්හතර දහස් අටසිය හැත්තෑ තුනයි ශත අනූහතක් වූ (රු. 6,334,873.97) මුදල හෝ දේපළ වෙන්දේසි දිනය වන විට නොගෙවා ඉතිරිව පවතින එහි යම් කොටසක් සහ 2023 මාර්තු මස 01 වැනි දින සිට ආරම්භව වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට සියයට පහළවයි දශම හතයි පහක (15.75%) අනුපාතිකයක් යටතේ එකී උකස් බැඳුම්කර සම්බන්ධයෙන් වන විට එකී අංක 1533 සහ 1305 දරන උකස් බැඳුම්කර මගින් ඇපයෙන් සුරක්ෂිත කරන ලද රුපියල් මිලියන පහයි තුන්ලක්ෂ අසූ පන් දහස් හාරසියයක් වූ (රු. 5,385,400.00) මුදලක් මත පොළිය ද අයකර ගැනීම සඳහා එකී උකස් බැඳුම්කර මගින් එකී ණය මුදල්/පහසුකම් සඳහා ඇපකරයක් වශයෙන් බැංකුව වෙත උකස් කරන ලද පහත විස්තර කර ඇති දේපළේ සහ පරිශ්‍රයේ සින්නක්කර අයිතිය, වෙනත් යම් අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතා ඇතුලත්වන එකී දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර එන්. යූ. ජයසූරිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ (ප්‍රධාන පනත) තමාවෙත පැවරී ඇති බලතල ප්‍රකාර බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මතකර සිටිනු ලැබේ.

### උපලේඛනය
### (ඉඩම හා පරිශ්‍රය පිළිබඳ විස්තරය)

1 වන අයිතමය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, බටහිර කෝරළේ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බටහිර

කෝරළේ පත්තුව, ප්‍රාදේශීය සභා සීමාව ඇතුලත, ඔට්ටමාවඩි - 3 කොට්ඨාස අංක 208 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඔට්ටමාවඩි ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, අංක T.P. 161260 දරන පිඹුරේ ලොට් අංක 4996 ලෙස ලකුණුකර නිරූපණය කර ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් උතුරේ සිට දකුණට බඹ 11 ක් ද, නැගෙනහිර සිට බටහිරට බඹ 9 ක් ද, වර්තමානයේ දී උතුරේ සිට දකුණට අඩි 50 ක් ද, නැගෙනහිර සිට බටහිරට අඩි 54 ක් වූ ද, උතුරට : ඒ. එම්. කාසීම් විසින් හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : මුත්තවන් පොඩියාර් පාර ද, දකුණට : පටුමග ද (අඩි 5 ක් පළල පටුමග), බටහිරට : ඉලවත්තම්බි රසීනා විසින් හිමිකම් කියන ඉඩම ද යන මායිම් තුල පිහිටා ඇත්තා වූ ද, ඉහත කී ලොට් අංක 4996 දරන බෙදාවෙන්කල ඉඩම කොටස සහ ඒ මත වූ වෙනත් සියලු දේ සහ එහි අන්තර්ගත වෙනත් සියලු අයිතිවාසිකම් ද වේ. මෙම ඉඩම මඩකලපුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක S0024/91 දරන වෙලුමේ/පත්තිරුවේ ලියාපදිංචි වී ඇත.

වඩාත් මෑතකාලීන මැනීමකට අනුව එම ඉඩම පහත සඳහන් පරිදි විස්තර වේ. එනම්,

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, බටහිර කෝරළේ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බටහිර කෝරළේ, පත්තුව ප්‍රාදේශීය සභා සීමාව ඇතුලත ඔට්ටමාවඩි - 3 කොට්ඨාස අංක 208 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඔට්ටමාවඩි ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, බලයලත් මිනින්දෝරු කේ. ෆාරුක් විසින් සාදන ලද (2019.10.29 දින මනින ලද) 2019.10.31 දින අංක. EP/2222 දරන මිනින්දෝරු පිඹුරේ ලොට් අංක 1 ලෙස විස්තර කර නිරූපණය කර ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0244 ක් හෙවත් පර්චස් නවයයි දශම හයයි තුනක් වූ ද (පර්චස් 9.63) උතුරට : ඒ. එම්. කාසීම් විසින් හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : මුත්තවන් පොඩියාර් පාර ද, දකුණට : පටුමග ද (අඩි 5 ක් පළල), බටහිරට : ඉලවත්තම්බි රසීනා විසින් හිමිකම් කියන ඉඩම ද යන මායිම්තුල පිහිටා ඇත්තා වූ ද, ඉහත කී ලොට් අංක 1 දරන බෙදාවෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ ගොඩනැගිල්ල සහ එහි අන්තර්ගත වෙනත් සියලු අයිතිවාසිකම් ද වේ.

උපාංග සමග විදුලි සැපයුම් පද්ධතිය, ජල සැපයුම් පද්ධති උපාංගය, විදුලි සංදේශ උපාංගය සහ වායු සමීකරණ උපාංගය ඇතුලු ඉහත සවිස්තරාත්මකව විස්තර කර ඇති ඉඩම සඳහා දැනට සවිකර ඇති හෝ ස්ථිරව එකතු කර ඇති හෝ මෙහි මින්මතු කලින් කල සවිකරනු ලැබිය හැකි හෝ ස්ථිරව එකතු කරනු ලැබිය හැකි එක්ව හා වෙන් වෙන් වශයෙන් වූ සියලු නිශ්චල යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ, උපකරණ, සවිතුරු, සවිකිරීම් සහ වෙනත් සේවාවන් ද එයට ඇතුළත් වේ.

**2 වන අයිතමය**

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරළේ පත්තුව - වාලච්චනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කෝරළේ පත්තුව - වාලච්චනේ ප්‍රාදේශීය සභා සීමාව ඇතුලත සෙම්මනෝඩයි (208D) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සෙම්මනෝඩයි ග්‍රාමයේ, පාසැල් පාර පිහිටා ඇත්තා වූ ද, බෙදා වෙන් කල ඉඩම් කොටසක් වන ප්‍රමාණයෙන් උතුරේ සිට දකුණට බඹ 9 1/2 ක් සහ නැගෙනහිර සිට බටහිරට බඹ 12 1/2 ක් වූ ද දැන් එම ඉඩම නැවත මැන බලයලත් මිනින්දෝරු ඒ. එම්. තජ්වුදීන් විසින් සාදන ලද 2014.04.22 දින අංක AMN/14/KP/3897 දරන මිනින්දෝරු පිඹුරේ ලොට් අංක 01 ලෙස විස්තර කර නිරූපණය කර ඇත්තාවූ ද ප්‍රමාණයෙන් පර්චස් දාහතරයි දශම නවයයි එකක් වූ ද (පර්චස් 14.91) උතුරට : පටුමග ද, නැගෙනහිරට : පාසැල් පාර ද, දකුණට : කුලන්දායිඋම්මා යන අයගේ දේපළ ද, බටහිරට: අයි. අහමඩ් ලෙබ්බේ යන අයගේ දේපළ ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ඒ තුළ පිහිටි ගොඩනැගිල්ල, ළිඳ සහ වෙනත් සියලු දේ ද වේ. එම ඉඩම මඩකලපුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ P 007/133 දරන වෙලුමේ/පත්තිරුවේ ලියාපදිංචි වී ඇත.

බලයලත් මිනින්දෝරු ඒ. එම්. තජ්වුදීන් විසින් සාදන ලද 2018.11.03 දින අංක AMN/18/KP/1040 දරන වඩාත් මෑතකාලීන පිඹුරකට අනුව එම ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර වේ; එනම්,

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරළේ පත්තුව මැද - වාලච්චනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කෝරළේ පත්තුව - වාලච්චනේ ප්‍රාදේශීය සභා සීමාව ඇතුලත සෙම්මනෝඩයි (208D) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සෙම්මනෝඩයි ග්‍රාමයේ පාසැල් පාර පිහිටා ඇත්තා වූ ද, බලයලත් මිනින්දෝරු ඒ. එම්. තජ්වුදීන් විසින් සාදන ලද 2018.10.30 දින සහ 2018.11.03 දින අංක AMN/18/KP/1040 දරන මිනින්දෝරු පිඹුරේ ලොට් අංක 01 ලෙස විස්තර කර නිරූපණයකර ඇත්තාවූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0377 ක් *හෙවත්* පර්චස් දාහතරයි දශම නවයයි එකක් වූ (පර්චස් 14.91) උතුරට : පටුමග ද, නැගෙනහිරට : පාසැල් පාර ද, දකුණට : කුලන්දායිඋම්මා යන අයගේ දේපළ ද, බටහිරට : අයි. අහමඩ් ලෙබ්බේ යන අයගේ දේපළ ද යන මායිම්තුළ පිහිටා ඇත්තා වූ ද, ඉහත කී ලොට් අංක 01 දරන බෙදා වෙන්කල ඉඩම් කොටස සහ එහි අන්තර්ගත ගොඩනැගිල්ල, ළිඳ සහ වෙනත් සියලු දේ ද වේ.

වඩාත් මෑතකාලීන මැනීමකට අනුව එම ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර වේ; එනම්

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ කෝරළේ පත්තුව, මැද - වාලච්චනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කෝරළේ පත්තුව - වාලච්චනේ ප්‍රාදේශීය සභා සීමාව ඇතුලත සෙම්මනෝඩයි (208D) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සෙම්මනෝඩයි ග්‍රාමයේ පාසැල් පාර පිහිටා ඇත්තා වූ ද, බලයලත් මිනින්දෝරු ඒ. එම්. තජ්වුදීන් විසින් සාදන ලද 2019.06.02 දින සහ 2019.06.06 දින අංක 1628

දරන මිනින්දෝරු පිඹුරේ ලොට් අංක 01 ලෙස ලකුණුකර නිරූපණයකර ඇත්තාවූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0377 ක් හෙවත් පර්චස් දාහතරයි දශම නවයයි එකක් වූ ද (පර්චස් 14.91) උතුරට : පටුමග ද, නැගෙනහිරට : පාසැල් පාර ද, දකුණට : කුලන්දායිඋම්මා යන අයගේ දේපළ ද, බටහිරට : අයි. අහමඩ් ලෙබ්බේ යන අයගේ දේපළ ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ඉහත කී ලොට් අංක 01 දරන බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ එහි අන්තර්ගත ගොඩනැගිලි, ළිඳ සහ වෙනත් සියලු දේ ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී.

02-737

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - මහරගම ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 2813610
වර්ණගේ ගිහාන් ෆොන්සේකා

2023 ජූනි 28 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. පී. එස්. ජයවීර විසින් 2018 ජනවාරි 10 වැනි දින සහතික කරන ලද අංක 3479 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද උකස් බැඳුම්කරය යටතේ (මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම හා පරිශ්‍රය මත) අයවිය යුතු මුදල් ගෙවීම පන්නිපිටිය, හෝකන්දර පාරේ, 1 වන පටුමගේ, අංක 1399/5 දරන ස්ථානයේ වර්ණගේ ගිහාන් ෆොන්සේකා ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්

ඉහත කී බැඳුම්කරය යටතේ (ප්‍රතිව්‍යුහගත නිවාස ණය අංක 2813610 හේතුවෙන්) රුපියල් මිලියන දහ තුනයි විසි නව දහස් අටසිය තිහ (රු. 13,029,830.00) ක මුළු මුදලක් 2023 මාර්තු 20 දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට දැන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන දහ තුනයි විසි නව දහස් අටසිය තිහ (රු. 13,029,830.00) ක මුදල අය කර ගැනීම සඳහා සහ 2023 මාර්තු 21 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 12,393,858.00 ක මුදලක් මත වර්ෂයකට 9% බැගින් වැඩිපුර පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අක 3479 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස්කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද ඉඩම හා පරිශ්‍රය මහරගම, කටුවාවල පාරේ, අංක 30/83 දරන ස්ථානයේ සහ එසේම කොළඹ 12, හල්ෆ්ට්ස්ඩෝප් වීදියේ, 2 වන මහලේ, අංක 200 දරන ස්ථානයේ "ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්" යන නාමය, විලාසය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන, බලයලත් වෙන්දේසිකරුවන් වන, ලොකු බණ්ඩා සේනානායක, මගුරු දෙනියේ වලව්වේ ත්‍රිවංක චරිත් සේනානායක සහ ගුරුගේ සුමනාවතී සේනානායක යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නාගරික සභා සීමා ඇතුලත මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 493 කලල්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුලත හෝකන්දර දකුණ, ධර්මායතන මාවතේ, වරිපනම් අංක 25/5 (කොටස) දරන ස්ථානයේ "වීලන්ගිරිය" නමැති දැන් "වෙල්ලන්ගිරිය" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, එන්. හේරත් විසින් 2003.03.12 වැනි දින පිළියෙල කරන ලද අංක 2181 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 8 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් R2 සහ 7 මගින් ද, නැගෙනහිරට : ලොට් 7, එම්. එස්. පෙරේරා සහ අනිත් අය විසින් හිමිකම්ලත් ඉඩම සහ අංක 586 දරන පිඹුරේ ලොට් A මගින් ද, දකුණට : එම්. එස්. පෙරේරා විසින් හිමිකම්ලත් ඉඩම, අංක 586 දරන පිඹුරේ ලොට් A සහ ලොට් 9 මගින් ද බස්නාහිරට : ලොට් 9 සහ R2 මගින් ද, මායිම් වූ එකී අංක 2181 දරන පිඹුර ප්‍රකාරව පර්චස් අට (පර්චස් 8) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 183/112 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 2181 දරන පිඹුරේ ලොට් R1 සහ R2 මතින් සහ ඔස්සේ මාර්ග අයිතිය භාවිතයට ඇති අයිතිය සමග වේ.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2023 ජූනි මස 28 වැනි දින.

02-819

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - ඇල්පිටිය ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 2656680

"B B කම්පැනි" හි කිංස්ලි ප්‍රසාන්ත බේරුවලගේ

2023 සැප්තැම්බර් 26 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

ඇල්පිටිය ප්‍රසිද්ධ නොතාරිස් නිලන්ත හාල්පන්දෙනිය විසින් 2018 ජූලි 31 වැනි දින සහතික කරන ලද අංක 2415 දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම හා පරිශ්‍රය උකස් කොට බැඳ දමා ඇති බටපොල, මහවත්ත හි "B B කම්පැනි" යන නාමය සහ විලාසය යටතේ තනි අයිතිකරුවෙක් ලෙස ව්‍යාපාරය පවත්වාගෙන යන බටපොල, මහවත්ත හි කිංස්ලි ප්‍රසාන්ත බේරුවලගේ ණයකරු හැටියට සහ ඉහත කී ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 2656680, නැවත ගෙවීම සඳහා ඇපයක් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද එකී බැඳුම්කර අංක 2415 මත අයවිය යුතු මුදල් ගෙවීම එකී කිංස්ලි ප්‍රසාන්ත බේරුවලගේ පැහැර හැර ඇති හෙයින්,

ඇල්පිටිය ප්‍රසිද්ධ නොතාරිස් නිලන්ත හාල්පන්දෙනිය විසින් 2018 ජූලි 31 වැනි දින සහතික කරන ලද අංක 2441 දරන උකස් බැඳුම්කරය සහ 2020 පෙබරවාරි 17 වැනි දින සහතික කරන ලද අංක 2858 දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම හා පරිශ්‍රය උකස් කොට බැඳ දමා ඇති බටපොල, මහවත්ත හි "B B කම්පැනි" යන නාමය සහ විලාසය යටතේ තනි අයිතිකරුවෙක් ලෙස ව්‍යාපාරය පවත්වාගෙන යන එකී කිංස්ලි ප්‍රසාන්ත බේරුවලගේ ණයකරු හැටියට සහ ඉහත කී ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 2656680, නැවත ගෙවීම සඳහා ඇපයක් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද එකී බැඳුම්කර අංක 2441 සහ 2858 මත අයවිය යුතු මුදල් ගෙවීම එකී කිංස්ලි ප්‍රසාන්ත බේරුවලගේ පැහැර හැර ඇති හෙයින්

සහ එකී ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 2656680 සම්බන්ධයෙන් එකී බැඳුම්කරය යටතේ වැඩිදුර පොළිය සමග රුපියල් මිලියන විසි හයයි අට ලක්ෂ පනස් එක දහස් පන්සිය අසූ පහ (රු. 26,851,585.00) ක මුළු මුදලක් 2023 ජූලි 20 දින දක්වා මුල් මුදල සහ පොළිය හේතුවෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට දැන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන විසි හයයි අට ලක්ෂ පනස් එක් දහස් පන්සිය අසූ පහ (රු. 26,851,585.00) ක මුදල අය කර ගැනීම සඳහා සහ 2023 ජූලි 21 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 23,299,900.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 10% බැගින් එකී ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 2656680 මත වැඩිදුර වාර්ෂික පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩුකොට එකී අංක 2415, 2441 සහ 2858 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද ඉඩම හා පරිශ්‍රය මහරගම, කටුවාවල පාරේ, අංක 30/83 දරන ස්ථානයේ සහ එසේම කොළඹ 12, හල්ෆ්ට්ස්ඩෝප් වීදියේ, 2 වන මහලේ, අංක 200 දරන ස්ථානයේ "ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්" යන නාමය, විලාසය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන, බලයලත් වෙන්දේසිකරුවන් වන, ලොකු බණ්ඩා සේනානායක, මගුරු දෙනියේ වලව්වේ ත්‍රිවංක චරිත් සේනානායක සහ ගුරුගේ සුමනාවතී සේනානායක යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### පළමුවන උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, කරන්දෙනිය ප්‍රාදේශීය සභා සීමා සහ කරන්දෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත 93 - කුරුඳුගහ-හැතැක්ම ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුලත කරන්දෙනිය, කුරුඳුගහහැතැක්ම හි පිහිටි "කුරුඳුගහබැද්ද සහ දෙනිය" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, ඩී. එම්. සිරිපාල විසින් 2018 පෙබරවාරි 03 වැනි දින පිළියෙල කරන ලද අංක 5932 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මෙම ඉඩමේ ලොට් C මගින් ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් D 2 හි ඉතුරු කොටස සහ පාර ඔස්සේ වෙන්කිරීම (පරණ බටපොල පාර) මගින් ද, දකුණට : මෙම ඉඩමේ ලොට් D 2 හි ලොට් D 2 A මගින් ද, සහ බස්නාහිරට : නිවාස සිට නිවාස වෙත පාර මගින් ද මායිම් වූ එකී අංක 5932 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දොළහයි දශම හතරයි පහ (පර්චස් 12.45) ක *හෙවත්* හෙක්ටෙයාර් 0.0315 ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ඉහත සඳහන් කරන ලද ඉඩම පහත දැක්වෙන ඉඩමේ උපබෙදුමක් වේ.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, කරන්දෙනිය ප්‍රාදේශීය සභා සීමා සහ කරන්දෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුලත 93 - කුරුඳුගහහැතැක්ම ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුලත කරන්දෙනිය, කුරුඳුගහහැතැක්ම හි පිහිටි "කුරුඳුගහබැද්ද සහ දෙනිය" හි ලොට් D 2 හි බෙදූ කොටස නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, පී. එච්. ඩී. සිල්වා විසින් 1994 මැයි 17 වැනි දින පිළියෙල කරන ලද අංක 421 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් D 2 B වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : එම ඉඩමේ ලොට් C මගින් ද, නැගෙනහිරට: එම ඉඩමේ ලොට් D 2 හි ඉතුරු කොටස සහ බටපොල සිට ඇල්පිටිය දක්වා ප්‍රධාන පාර මගින් ද, දකුණට : එම ඉඩමේ ලොට් D 2 A මගින් ද සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් D 2 A මගින් ද මායිම් වූ එකී අංක 421 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තිස් තුනයි දශම හතයි පහ (පර්චස් 33.75) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A 164/206 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු පී. ඒ. රේබින් චන්ද්‍රසිරි විසින් 1998 පෙබරවාරි 10 වැනි දින පිළියෙල කරන ලද අංක 2426 දරන මිනුම් සැලැස්මේ නැවත මැනීමේ අගයකට අනුව එකී ලොට් D2B පහත පරිදි විස්තර වේ.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ කරන්දෙනිය ප්‍රාදේශීය සභා සීමා සහ කරන්දෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුලත 93 - කුරුඳුගහහැතැක්ම ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුලත කරන්දෙනිය, කුරුඳුගහහැතැක්ම හි පිහිටි "කුරුඳුගහබැද්ද සහ දෙනිය" හි ලොට් D2 හි බෙදූ කොටස නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, පී. ඒ. රේබින් චන්ද්‍රසිරි විසින් 1998 පෙබරවාරි 10 වැනි දින පිළියෙල කරන ලද අංක 2426 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් D2B වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : එම ඉඩමේ ලොට් C මගින් ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් D2 හි ඉතුරු කොටස සහ ඇල්පිටිය බටපොල ප්‍රධාන පාර මගින් ද, දකුණට : මෙම ඉඩමේ ලොට් D2 හි ලොට් D2A මගින් ද සහ බස්නාහිරට: මෙම ඉඩමේ ලොට් D2 හි ලොට් D2A මගින් ද මායිම් වූ එකී අංක 2426 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තිස් තුනයි දශම හතයි පහ (පර්චස් 33.75) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

**දෙවන උපලේඛනය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගඟ බොඩ පත්තුවේ වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා සීමා සහ වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුලත 223 - ඇත්කඳුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුලත ඇත්කඳුර පිහිටි "ලෙන්තුගේවත්තේකැළේ (TP 268332) සහ වතුරාවේදෙනිය *හෙවත්* කොළවේගොඩදෙනිය (TP 331708) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, ඕ. එස්. බී. කුමාරසිරි විසින් 2018 ජූනි 17 වැනි දින පිළියෙල කරන ලද අංක 6005A දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් A වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : TP 251098, PP 8697 හි ලොට් 25810 මගින් ද නැගෙනහිරට : PP 8697 හි ලොට් 25810 සහ 25808 සහ රජයේ ඉඩම මගින් ද, දකුණට : රජයේ ඉඩම මගින් ද සහ බස්නාහිරට : රජයේ ඉඩම සහ ලොට් B මගින් ද මායිම් වූ එකී අංක 6005A දරන පිඹුර ප්‍රකාරව අක්කර පහයි රූඩ් තුනයි පර්චස් දොළහ (අ.5, රූ.3, පර්.12) ක *හෙවත්* හෙක්ටෙයාර් 2.35725 ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ඉහත සඳහන් කරන ලද ඉඩම පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමක් වේ.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගඟ බොඩ පත්තුවේ වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා සීමා සහ වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුලත 223 - ඇත්කඳුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුලත ඇත්කඳුර පිහිටි "ලෙන්තුගේවත්තේකැළේ (TP 268332) සහ වතුරාවේදෙනිය *හෙවත්* කොළවේගොඩදෙනිය (TP 331708) " නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, එම්. පී. රංජිත් ආනන්ද විසින් 2007 මැයි 07 වැනි දින පිළියෙල කරන ලද අංක 2290 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් A වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : TP 251098, PP 8697 හි ලොට් 25810 මගින් ද, නැගෙනහිරට : PP 8697 හි ලොට් 25810 සහ 25808 සහ රජයේ ඉඩම මගින් ද දකුණට: රජයේ ඉඩම මගින් ද සහ බස්නාහිරට : රජයේ ඉඩම සහ TPs 331354 සහ 251097 මගින් ද මායිම් වූ එකී අංක 2290 දරන පිඹුර ප්‍රකාරව අක්කර පහයි රූඩ් තුනයි පර්චස් දොළහ (අ.5, රූ.3, පර්.12) ක *හෙවත්* හෙක්ටෙයාර් 2.35725 ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය ඇල්පිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව P 27/113 යටතේ ලියාපදිංචි කර ඇත.

2023 සැප්තැම්බර් මස 26 වැනි දින.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

02-811

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2022 ඔක්තෝබර් 05 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. එන්. එස්. උපුල්දෙනිය මහත්මිය විසින් සහතික කරන ලද 2017.03.01 දිනැති අංක 304 දරන උකස් බැඳුම්කරය අනුව ණය මුදලක් මත 2022.07.25 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 129,637,966.04 (රුපියල් දොළොස් කෝටි අනූ හය ලක්ෂ තිස්හත් දහස් නවසිය හැටහයයි ශත හතරක්) මුදලක් සමග රු. 92,214,376.44 ක (රුපියල් නව කෝටි විසි දෙලක්ෂ දහහතර දහස් තුන්සිය හැත්තෑ හයයි ශත හතලිස් හතරක්) මුදලක් මත වසරකට සියයට විසිහතරයි දශම දෙකයි හතක් (24.27%) බැගින් 2022.07.26 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද ගෙලිඔය, ගම්පොල පාර, අංක 150 සහ 150/2 සහ වෙලම්බොඩ, මහනුවර පාර, අංක 184බී හි පිහිටි සීමා සහිත රෝස් ෆෙල්ඩ් පුද්ගලික සමාගම වෙතින් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. එන්. එස්. උපුල්දෙනිය මහත්මිය විසින් සහතික කරන ලද 2017.03.01 දිනැති අංක 304 දරන උකස් බැඳුම්කරය අනුව ණය මුදලක් මත රු. 129,637,966.04 (රුපියල් දොළොස් කෝටි අනූ හය ලක්ෂ තිස්හත් දහස් නවසිය හැට හයයි ශත හතරක්) මුදලක් මත 2022.07.26 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී පරිදි තවදුරටත් පොළිය ද ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද අය කර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත අංක 182/3, (50/3), හි M/s T & H ඔක්ෂන් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළකිරීමට ලංකා බැංකුව, ගම්පොල අධිශ්‍රේණි ශාඛාවේ ජ්‍යෝෂ්ඨ කළමනාකාර මහත්මිය හට ද මෙයින් බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟපළාත කෝරළේ සහ උඩුනුවර ප්‍රාදේශීය සභා සීමාවේ දෙහිපාගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිහිටි "වියියාල කුඹුරේ අප්පුහාමිගේවත්ත" *හෙවත්* "වගල කුඹුරේවත්ත" සහ "හිටිනගෙදර වත්තේ" කොටස නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු බී. එම්. එස්. බී. කරුණාරත්න විසින් සාදන ලද 2021.05.17 දින උප බෙදුමක් කළ 2016.04.27 දිනැති අංක 9588 දරන පිඹුරේ ලොට් B ලෙස ලකුණු කර බෙදන ලද්දා වූ එකී ලොට් B, උතුරට හිටිනගෙදර වත්ත කොටස වෙන්කරන පැල ඉනි වැට ද, නැගෙනහිරට : නුවර සිට ගම්පොල දක්වා යන ආර්. ඩී. ඒ. මහා මාර්ගය ද, දකුණට : බලයලත් මිනින්දෝරු බී. එම්. එස්. බී. කරුණාරත්න විසින් සාදන ලද අංක 9587 දරන පිඹුරේ ලොට් A ද, බස්නාහිරට : ඌරුඅන්ගහේන ද, මායිම්ව රූඩ් දෙකයි, පර්චස් දහතුනයි දශම අටක් (රූ.2, පර්.13.8) හෝ හෙක්ටෙයාර 0.2372 ක් බිම් ප්‍රමාණයකින් යුත් ඉඩම සමග එහි පිහිටි ගොඩනැගිලි වැව්ලි සහ සියලු දේ සමග වේ.

එකී උපබෙදුම පහත සඳහන් ඉඩමේ කොටසකි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟ පළාත කෝරළේ සහ උඩුනුවර ප්‍රාදේශීය සභා සීමාවේ, දෙහිපාගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දෙහිපාගොඩ, ගම්පොල මාර්ගයේ පිහිටි, වියියාල කුඹුරේ, අප්පුහාමිගේවත්ත *හෙවත්* වගල කුඹුරේවත්ත සහ හිටිනගෙදර වත්තේ කොටස නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු බී. එම්. එස්. බී. කරුණාරත්න විසින් සාදන ලද (නමුත් 2016.04.22 ලෙස ලියාපදිංචි කර ඇති) වඩා නිවැරදි 2016.04.27 දිනැති අංක 8447 දරන පිඹුරේ ලොට් 01 ලෙස ලකුණු කළ එකී ලොට් 01, උතුරට : හිටිනගෙදර වත්ත කොටස වෙන්කරන පැල ඉනි වැට ද, නැගෙනහිරට නුවර සිට ගම්පොළ දක්වා යන මහා මාර්ගය ද, දකුණට : සහ නිරිතදිගට අරුමදෙනියවත්ත සහ ඌරුඅන්ගහේන ද, බස්නාහිරට : ඌරුඅන්ගහේන ද, මායිම්ව අක්කර එකයි, පර්චස් තිස්තුනයි දශම අටක් (අ.01, රූ.0, පර්.33.8) හෝ හෙක්ටෙයාර 0.49017 ක් බිම් ප්‍රමාණයකින් යුත් ඉඩම සමග ගුරුදෙනිය තේ කර්මාන්ත ශාලාව යනුවෙන් හඳුන්වන සහ නමැති අංක බීඑෆ්/26 දරන තේ කොමසාරිස් ලියාපදිංචි අංකය දරන තේ කර්මාන්ත ශාලාව සමග එහි පිහිටි අනෙකුත් ගොඩනැගිලි සහ එකී කාර්මාන්තශාලාවේ දැනට පාවිච්චි කරන එහි සවිකර ඇති යන්ත්‍ර සූත්‍ර ගෘහභාණ්ඩ සවිකිරීම් මෙවලම් උපකරණ සහ අනෙකුත් ගොඩනැගිලි ව්‍යුහයන් වැව්ලි ඇතුළු සියලු දේ සමග වේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචිකිරීමේ කාර්යාලයේ C 511/129 හි ලියාපදිංචි කර ඇත.

අංක 8447 දරන පිඹුරේ එකී ලොට් 01, පහත සඳහන් ඒකාබද්ධ කළ ඉඩම්වල නැවත මිනුමකි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟ පළාත කෝරළේ සහ උඩුනුවර ප්‍රාදේශීය සභා සීමාවේ, දෙහිපාගොඩ නැගෙනහිර අංක 37 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දෙහිපාගොඩ, ගම්පොල මාර්ගයේ පිහිටි, වියියාල කුඹුරේ, අප්පුහාමිගේවත්ත *හෙවත්* වගල කුඹුරේවත්ත නමැති

ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩී. ඒ. ජයගොඩ විසින් සාදන ලද 1993.03.30 දිනැති අංක 3208 දරන පිඹුරේ ලොට් 01 ලෙස ලකුණු කළ බෙදන ලද්දා වූ බලයලත් මිනින්දෝරු ඩී. ඒ. ජයගොඩ විසින් සාදන ලද අංක 3208 දරන පිඹුරේ මායිම් නිරූපනය කළ එකී ලොට් 01, උතුරට : අංක 3208 දරන පිඹුරේ ලොට් 02 ලෙස ලකුණු කළ හිටිනගෙදර වත්ත කොටස ද, නැගෙනහිරට නුවර සිට ගම්පොල දක්වා යන මහා මාර්ගය ද, දකුණට : සහ නිරිතදිගට අරුමදෙනියවත්ත සහ ඌරුඅන්ග හේන ද, බස්නාහිරට : ඌරුඅන්ගහේන ද මායිම්ව හෙක්ටයාර බිංදුවයි දශම තුනයි හතයි හතයි බිංදුවක් (හෙක්. 0.3770) හෝ ඒ හා සමාන රූඩ් තුනයි පර්චස් දහතුනයි දශම පහක් (අ.0, රූ.3, පර්. 13.5) බිම් ප්‍රමාණයකින් යුත් ඉඩම සමග ගුරුදෙනිය තේ කර්මාන්ත ශාලාව යනුවෙන් හඳුන්වනු සහ නමැති අංක බීඑෆ්/26 දරන තේ කොමසාරිස් ලියාපදිංචි අංකය දරන තේ කර්මාන්ත ශාලාව සමග එහි පිහිටි අනෙකුත් ගොඩනැගිලි සහ එකී කර්මාන්තශාලාවේ දැනට පාවිච්චි කරන එහි සවිකර ඇති යන්ත්‍ර සූත්‍ර, ගෘහභාණ්ඩ, සවිකිරීම්, මෙවලම්, උපකරණ සහ අනෙකුත් ගොඩනැගිලි, ව්‍යුහයන්, වැව්ලි ඇතුළු සියලු දේ සමග වේ. ගෙලිඔය, ගම්පොල පාර, වරිපනම් අංක 150, 150/2 දරන මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍ර C 437/244 හි ලියාපදිංචි කර ඇත.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟ පළාත කෝරළේ සහ උඩුනුවර ප්‍රාදේශීය සභා සීමාවේ දෙහිපාගොඩ නැගෙනහිර අංක 37 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, දෙහිපාගොඩ, ගම්පොල පාරේ පිහිටි, හිටිනගෙදර වත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩී. ඒ. ජයගොඩ විසින් සාදන ලද 1993.03.30 දිනැති අංක 3208 දරන පිඹුරේ ලොට් 02 ලෙස ලකුණු කළ බෙදන ලද්දා වූ ඉඩම් කැබැල්ල උතුරට : අංක 3208 දරන පිඹුරේ ලොට් 02 ලෙස ලකුණු කළ හිටිනගෙදර වත්තේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : නුවර සිට ගම්පොල දක්වා යන මහා මාර්ගය ද දකුණට : එකී අංක 3208 දරන පිඹුරේ ලොට් 02 ද, බස්නාහිරට : ඌරුඅන්ගහේන ද මායිම්ව හෙක්ටෙයාර් බිංදුවයි දශම එකයි පහයි දෙකයි හතරයි හතක් (හෙක්. 0.15247) හෝ ඒ හා සමාන රූඩ් එකයි පර්චස් විස්සයි දශම තුනක් (අ.0, රූ.1, පර්.20.3) බිම් ප්‍රමාණයකින් යුත් ඉඩම සමග එහි පිහිටි සියලු දේ සමග වේ.

මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 506/107 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

ඩී. ජී. වී. එල්. බණ්ඩාර මිය,
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණි.

ලංකා බැංකුව
අධිශ්‍රේණි ශාඛාව,
ගම්පොල.

02-821

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - විජේරාම ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය

අටුළුගමගේ සාලිය ලුසියන් විමලරත්න සිල්වා

2023 නොවැම්බර් මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් අටුළුගමගේ සාලිය ලුසියන් විමලරත්න සිල්වා වෙත ප්‍රදානය කරන ලද රු. 22,000,000.00 (රුපියල් මිලියන විසි දෙකක් පමණකි) ක නිවාස ණය පහසුකම ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ඩී. ඒ. කේ. අධිකාරි විසින් ලියා සහතික කරන ලද 2020.11.23 දිනැති අංක 4287 දරන උකස් බැඳුම්කරය මගින් අටුළුගමගේ සාලිය ලුසියන් විමලරත්න සිල්වා ණයකරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

තව ද, එකී අටුළුගමගේ සාලිය ලුසියන් විමලරත්න සිල්වා විසින් එකී බැඳුම්කරය මත සහ ඔහු වෙත ප්‍රදානය කරන ලද එකී රු. 22,000,000.00 (රුපියල් මිලියන විසි දෙකක් පමණකි) ක නිවාස ණය පහසුකම මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කරය මත 2023 අගෝස්තු 08 වැනි දිනට රු. 21,521,255.43 (රුපියල් මිලියන විසි එකයි පන් ලක්ෂ විසි එක් දහස් දෙසිය පනස් පහයි ශත හතළිස් තුනක) මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව, මුදල් ලැබෙනතුරු කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 20,969,541.97 ක ප්‍රාග්ධන හිඟ මුදල මත 2023 අගෝස්තු 09 වැනි දින සිට වර්ෂයකට 9.5%ක අනුපාතයට සහ ප්‍රදානය කළ දිනෙන් පසු ඊළඟ වසර 10 සඳහා AWPLR+2.5ක අනුපාතයට අනුව තවදුරටත් පොළිය ද සමග එකී රු. 21,521,255.43ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා එකී අංක 4287 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, මුළු දිවයිටම බලයලත් වෙන්දේසිකරු ඒ. එස්. කුමාරි මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ

(විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කැස්බෑව නගර සභා සීමාව තුළ 566 - දාම්පේ ග්‍රාම නිලධාරි වසම තුළ දාම්පේ සහ දූල්තර පිහිටි දම්පේ පාර, වරිපනම් අංක 119 - දරන "කහටගහවත්ත දෙල්ගහ කුරුදුවත්ත, නාරායවත්ත, දෙල්ගහ ඕවිට, මලබොඩගහවත්ත, කනත්තේවත්ත සහ ගොරකගහවත්ත *හෙවත්* කොස්ගහවත්ත අන්තරගත සියඹලාගහ ගෟප්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. කේ. එස්. බමුණුසිංහ මයා විසින් සාදන ලද අංක 2881 සහ 2015 ජනවාරි 22 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 6 වශයෙන් ලකුණුකර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : කේ. රුබෙක්ස් ප්‍රනාන්දු සහ තවත් අය විසින් හිමිකම්පාන ලද දේපළ සහ ලොට් 7 ද, නැගෙනහිරට : අංක 2881 දරන පිඹුරේ ලොට් 7 සහ 5 ද, දකුණට : අංක 2881 දරන පිඹුරේ ලොට් 5 සහ දාම්පේ පාර සහ බස්නාහිරට : දාම්පේ පාර සහ කේ. රුබෙක්ස් ප්‍රනාන්දු සහ තවත් අය හිමිකම්පාන ලද දේපළ ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් එකොළහක් (පර්. 11) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ශිරෝමි හල්ලොලුව,
නීති ප්‍රධානි/ මාණ්ඩලික ලේකම්.

02-756

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - ඒකල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය

රණවීර මුදියන්සේලාගේ චාමිකා නිලානි කුමාරි රණවීර.

2024 ජනවාරි මස 24 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් රණවීර මුදියන්සේලාගේ චාමිකා නිලානි කුමාරි රණවීර වෙත ප්‍රදානය කරන ලද රු. 9,500,000.00 (රුපියල් මිලියන නවයයි පන් ලක්ෂයක් පමණකි) ක නිවාස ණය පහසුකම ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් ලියා සහතික කරන ලද 2019.04.10 දිනැති අංක 14196 දරන උකස් බැඳුම්කරය මගින් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ රණවීර මුදියන්සේලාගේ චාමිකා නිලානි කුමාරි රණවීර ණයකරු වශයෙන් උකස්කර බැඳතබා තිබේ.

තව ද, එකී රණවීර මුදියන්සේලාගේ චාමිකා නිලානි කුමාරි රණවීර විසින් එකී බැඳුම්කරය මත සහ අනිකුත් පහසුකම් අතර ඇය වෙත ප්‍රදානය කරන ලද එකී රු. 9,500,000.00 (රුපියල් මිලියන නවයයි පන් ලක්ෂයක් පමණකි) ක නිවාස ණය පහසුකම මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කරය මත 2023 නොවැම්බර් 15 වැනි දිනට රු. 8,794,300.64 (රුපියල් මිලියන අටයි හත් ලක්ෂ අනූ හතර දහස් තුන්සියයයි ශත හැට හතරක) මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 8,306,636.32 ක ප්‍රාග්ධන හිඟ මුදල මත 2023 නොවැම්බර් 16 වැනි දින සිට වර්ෂයකට 15%ක අනුපාතයට අනුව තවදුරටත් පොළිය ද සමග එකී රු. 8,794,300.64ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා එකී අංක 14196 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු එන්. යූ. ජයසූරිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කලුගම්මන සියපත්තුවේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 435 - හල්ලොලුව ග්‍රාම නිලධාරි වසම තුළ හල්ලොලුවේ පිහිටි "වටගොඩවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එම්. ඩී. ප්‍රේමරත්න විසින් සාදන ලද අංක 1812 සහ 2017 අගෝස්තු 10 දින දරන මානක පිඹුරේ දැක්වෙන ලොට් 2 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරු - නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 4, දකුණු - නැගෙනහිරටඃ

සෝමාරාම පන්සලට අයත් ඉඩම ද, දකුණටඃ ලොට් 3 සහ සෝමාරාම පන්සලට අයත් ඉඩම ද, දකුණු - බස්නාහිරට : ලොට් 1 සහ උතුරු - බස්නාහිරට : පන්සලේ සිට ප්‍රධාන පාර දක්වා පාර ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් විසි හතරක් (පර්. 24) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ ඇති ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ශිරෝමි හල්ලොලුව,
නීති ප්‍රධානි/ මාණ්ඩලික ලේකම්.

02-806/1

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - දිවුලපිටිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය

උඩවත්තගේ අරුණ චමින්ද කුමාර උදයසිරි සහ උඩවත්තගේ සෝමපාල.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් උඩවත්තගේ අරුණ චමින්ද කුමාර උදයසිරි සහ උඩවත්තගේ සෝමපාල වෙත ප්‍රදානය කරන ලද රු. 6,500,000.00 (රුපියල් මිලියන හයයි පන් ලක්ෂයක් පමණකි) ක සංවර්ධන ණය පහසුකම ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන්, උඩවත්තගේ අරුණ චමින්ද කුමාර උදයසිරි සහ උඩවත්තගේ සෝමපාල ණයකරුවන් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, ප්‍රසිද්ධ නොතාරිස් සී. දයාරත්න විසින් ලියා සහතික කරන ලද 2022.09.29 දිනැති අංක 16107 දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා ඇති අතර, ප්‍රසිද්ධ නොතාරිස් සී. දයාරත්න විසින් ලියා සහතික කරන ලද 2016.11.24 දිනැති අංක 11381 දරන උකස් බැඳුම්කරය මගින් මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

තව ද, එකී උඩවත්තගේ අරුණ චමින්ද කුමාර උදයසිරි සහ උඩවත්තගේ සෝමපාල විසින් එකී බැඳුම්කර මත සහ ප්‍රදානය කරන ලද එකී රු. 6,500,000.00 (රුපියල් මිලියන හයයි පන් ලක්ෂයක් පමණකි) ක සංවර්ධන ණය පහසුකම මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් අනිකුත් පහසුකම් අතර එකී බැඳුම්කර මත 2023 අගෝස්තු 09 වනි දිනට රු. 6,564,946.28 (රුපියල් මිලියන හයයි පන් ලක්ෂ හැට හතර දහස් නවසිය හතළිස් හයයි ශත විසි අට)ක මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 6,350,000.00ක ප්‍රාග්ධන හිඟය මත 2023 අගෝස්තු 10 වැනි දින සිට වර්ෂයකට 15%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග එකී රු. 6,564,946.28ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා එකී අංක 16107 සහ 11381 දරන බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද සහ මෙහි උපලේඛනවල විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

#### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 97/ඒ, බොමුගම්මන ග්‍රාමනිලධාරි වසම තුළ බොමුගම්මන ගමේ පිහිටි "පරගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩබ්. එන්. ධම්මික විසින් සාදන ලද 2016.12.12 දින මනින ලද සහ 2017.06.15 දින නිකුත් කරන ලද අංක 1036 දරන පිඹුරේ දැක්වෙන ලොට් පී වශයෙන් ලකුණු කරන බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : විජිත පුෂ්පකුමාර හිමිකම්පාන ලද ඉඩම සහ පාර ද, නැගෙනහිරට : අංක 742ඒ දරන පිඹුරේ දැක්වෙන ලොට් 02 (පාර) ද, දකුණට : ඩබ්. ඒ. ඥානවතී හිමිකම්පාන ලද ඉඩම සහ බස්නාහිරට : කපිල කුමාර සහ විජිත පුෂ්පකුමාර හිමිකම්පාන ලද ඉඩම් ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් විසි හයයි දශම එකක් (පර්. 26.1) *හෙවත්* හෙක්ටයාර් 0.0660ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි සෑම සියලු දේද සමග වේ.

ඉහත කී අංක 742ඒ දරන පිඹුරේ දැක්වෙන ලොට් 2 (අඩි 8ක් පළල පාර) මතින් හා ඒ දිගේ වන මාර්ග අයිතිය සහ අනිකුත් ඒ හා බැඳුනු අයිතිවාසිකම් ද සමග වේ.

#### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ, හාපිටිගම් කෝරළේ,

යටිගහ පත්තුවේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 50බී, පරණ හන්දිය ග්‍රාමනිලධාරී වසම තුළ බලගල්ලේ පිහිටි "බලගල්ලවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩබ්. එන්. ධම්මික විසින් සාදන ලද 2015.02.17 දින මනින ලද සහ 2016.09.19 දින නිකුත් කරන ලද අංක 973 දරන පිඹුරේ දැක්වෙන ලොට් 40ඒ වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : අංක 1800 දරන මූලික පිඹුරේ ලොට් 28 ද, නැගෙනහිරට : බලන්ගල්ලවත්ත සහ අංක 1800 දරන මූලික පිඹුරේ ලොට් 41 ද, දකුණට : අංක 1800 දරන මූලික පිඹුරේ ලොට් 41 සහ බස්නාහිරට : අංක 1800 දරන මූලික පිඹුරේ ලොට් 29 ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් තිස් තුනයි දශම දෙකක් (පර්. 33.2) *හෙවත්* හෙක්ටයාර් 0.0840ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි සෑම සියලු දේද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ශිරෝමි හල්ලොලුව,
නීති ප්‍රධානි/ මාණ්ඩලික ලේකම්.

02-806/2

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - දිවුලපිටිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය

සිරිමාන්න අප්පුහාමිලාගේ අයේෂා දිනිති සිරිමාන්න.

2024 ජනවාරි මස 24 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් සිරිමාන්න අප්පුහාමිලාගේ අයේෂා දිනිති සිරිමාන්න වෙත ප්‍රදානය කරන ලද රු. 10,300,000.00ක නිවාස ණය පහසුකම ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ජී. එම්. එම්. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද 2020.12.03 දිනැති අංක 6908 දරන උකස් බැඳුම්කරය මගින් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සිරිමාන්න අප්පුහාමිලාගේ අයේෂා දිනිති සිරිමාන්න ණයකරු වශයෙන් උකස්කර බැදතබා තිබේ.

තව ද, එකී සිරිමාන්න අප්පුහාමිලාගේ අයේෂා දිනිති සිරිමාන්න විසින් එකී බැඳුම්කරය මත සහ අනිකුත් පහසුකම් අතර ඇය වෙත ප්‍රදානය කරන ලද එකී රු. 10,300,000.00ක නිවාස ණය මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කරය මත 2023 දෙසැම්බර් 11 වැනි දිනට රුපියල් මිලියන නවයයි නව ලක්ෂ දහ දහස් හත්සිය හතළිස් එකයි ශත තිස් එකක (රු. 9,910,741.31ක) මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 9,590,538.27ක ප්‍රාග්ධන හිගය මත 2023 දෙසැම්බර් 12 වැනි දින සිට වර්ෂයකට 14.5% ක අනුපාතයට අනුව තවදුරටත් පොළිය ද සමග එකී රු. 9,910,741.31ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා එකී අංක 6908 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද සහ මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

**උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) අලුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ කිඹුලාපිටිය මධ්‍යම ග්‍රාම නිලධාරී වසම තුළ කිඹුලාපිටිය ගමේ පිහිටි "ගොඩපොරගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද අංක 2593 සහ 1985.11.12 (වඩාත් නිවැරදිව 1985.07.19 දින දරන) දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 56 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් 31, නැගෙනහිරට : ලොට් 57 ද, දකුණට: ලොට් 1 (අඩි 30ක් පළල පාර) සහ බස්නාහිරට : ලොට් 55 ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දහහතරක් (පර්. 14) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ ඇති ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමග වේ.

ඉහත දේපළ මෑතකදී මැනීමකට ලක්කරන ලද අතර, එය බලයලත් මිනින්දෝරු ඒ. සී. ද වන්ස වික්‍රමරත්න විසින් සාදන ලද අංක 3957 සහ 2020.07.24 දින දරන පිඹුරේ දක්වා තිබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) අලුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ කිඹුලාපිටිය මධ්‍යම ග්‍රාම නිලධාරී වසම තුළ කිඹුලාපිටිය ගමේ පිහිටි "ගොඩපොරග හවත්ත" නමැති ඉඩමට සාදන ලද එකී අංක 3957 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 වශයෙන් ලකුණු කර ඇති බෙදා

වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට: අංක 2593 දරන පිඹුරේ ලොට් 31, නැගෙනහිරට : අංක 2593 දරන පිඹුරේ ලොට් 57 ද, දකුණට : ආඩිඅම්බලම පාර දක්වා දිවෙන අඩි 30 ක් පළල පාර (අංක 2593 දරන පිඹුරේ ලොට් 1) සහ බස්නාහිරට : අංක 2593 දරන පිඹුරේ ලොට් 55 ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දහහතරක් (පර්. 14) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ ඇති ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමග වේ.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) අලුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ කිඹුලාපිටිය මධ්‍යම ග්‍රාම නිලධාරී වසම තුළ කිඹුලාපිටිය ගමේ පිහිටි "ගොඩපොරගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද අංක 2593 සහ 1985.11.12 (වඩාත් නිවැරදිව 1985.07.19 දින දරන) දින දරන පිඹුරේ දක්වෙන ලොට් 57 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට: ලොට් 30, නැගෙනහිරට ලොට් 58 ද, දකුණට : ලොට් 1 (අඩි 30ක් පළල පාර) සහ බස්නාහිරට : ලොට් 56 ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දහහතරක් (පර්. 14) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ ඇති ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමග වේ.

ඉහත දේපළ මෑතකදී මැනීමකට ලක්කරන ලද අතර, එය බලයලත් මිනින්දෝරු ඒ. සී. ද වන්ස වික්‍රමරත්න විසින් සාදන ලද අංක 3958 සහ 2020.07.24 දින දරන පිඹුරේ දක්වා තිබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) අලුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ කිඹුලාපිටිය මධ්‍යම ග්‍රාම නිලධාරී වසම තුළ කිඹුලාපිටිය ගමේ පිහිටි "ගොඩපොරග හවත්ත" නමැති ඉඩමට සාදන ලද එකී අංක 3958 දරන පිඹුරේ දක්වෙන ලොට් 1 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : අංක 2593 දරන පිඹුරේ ලොට් 30, නැගෙනහිරට : අංක 2593 දරන පිඹුරේ ලොට් 58 ද, දකුණට : අංක 2593 දරන පිඹුරේ ලොට් 1 (අඩි 30ක් පළල පාර) සහ බස්නාහිරට : අංක 2593 දරන පිඹුරේ ලොට් 56 ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දහහතරක් (පර්. 14) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ ඇති ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ශිරෝමි හල්ලොලුව,
නීති ප්‍රධානි/ මාණ්ඩලික ලේකම්.

02-806/3

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - කඳාන ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 2918652
සිලෝන් හෙල්දි හාවස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්

2023 ජූලි 28 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් වී. පී. ඩයස් විසින් 2022 මැයි 25 වැනි දින සහතික කරන ලද අංක 4781 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලියාපදිංචි කිරීමේ අංක PV 00233747 දරන සමාගම් පනත යටතේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වන රාගම, ඇලපිටිවල, තප්පහේනවත්ත, අංක 5/17 දරන ස්ථානයේ එහි ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සිලෝන් හෙල්දි හාවස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ රාගම, ඇලපිටිවල, තප්පහේනවත්ත, අංක 5/17 දරන ස්ථානයේ කත්තොට රාළලාගේ දොන් උපේන්ද්‍ර ලක්ෂ්මන් ජයවර්ධන උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද (මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති ඉඩම සහ පරිශ්‍රය මත)

සහ ඉහත කී බැඳුම්කරය යටතේ [කෘෂි කාලීන ණය අංක 2918652 බැංකු අරමුදල සඳහා දිය යුතු මුළු ගණන] වෙනත් කරුණු අතර, 2023 ජූනි 09 දින වන විට රුපියල් මිලියන තිහයි හය ලක්ෂ අනූ දහස් අටසිය හැට නවයයි ශත පනස් හයක (රු. 30,690,869.56ක) මුදලක් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට දැන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන තිහයි හය ලක්ෂ අනූ දහස් අටසිය හැට නවයයි ශත පනස් හයක (රු. 30,690,869.56) ක මුදල අයකර ගැනීම සඳහා සහ 2023 ජූනි 10 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 25,000,000.00ක මුදලක් මත වර්ෂයකට AWPLR අගය + 3.5% බැගින් (2023 ජූනි 09 දින වන විට 24.78%) වැඩිදුර වාර්ෂික පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩුකොට එකී අංක 4781 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද ඉඩම හා පරිශ්‍රය මහරගම, කටුවාවල පාරේ, අංක 30/83 දරන ස්ථානයේ සහ එසේම කොළඹ 12, හල්ෆ්ට්ස්ඩොෆ් වීදියේ, 2 වන මහලේ, අංක 200 දරන

ස්ථානයේ "ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්" යන නාමය, විලාසය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන, බලයලත් වෙන්දේසිකරුවන් වන, ලොකු බණ්ඩා සේනානායක, මගුරු දෙනියේ වලව්වේ ත්‍රිවංක චරිත් සේනානායක සහ ගුරුගේ සුමනාවතී සේනානායක යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 434, නිකගොල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා සීමා ඇතුළත තිත්තවැලි ගම් දහය කෝරළේ, හිරියාල හත්පත්තුවේ, තිත්තවැල්ල ගමේ පිහිටි "කුඹුක් වැව එස්ටේට් *හෙවත්* අජ්මීර් ෆාම්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. එල්. සී. චන්ද්‍රරත්න විසින් 2020.10.25 වැනි දින පිළියෙල කරන ලද අංක 522 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : වඩුගම F.V.P. 2784 මගින් ද, නැගෙනහිරට : ඇළ නමුත් වඩා නිවැරදිව ලොට් 2, ඇළ සහ වඩුගම F.V.P. 2784 මගින් ද, දකුණට : ප්‍රාදේශීය සභා පාර මගින් ද සහ බස්නාහිරට : වඩුගම සිට නිකගොල්ල දක්වා පාර නමුත් වඩා නිවැරදිව වඩුගම සිට නිකගොල්ල දක්වා පාර සහ වඩුගම F.V.P. 2784 මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව අක්කර දහ අටයි රූඩ් තුනයි පර්චස් විස්සයි දශම පහක (අ.18, රූ.3, පර්.20.5) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N 253/117 යටතේ ලියාපදිංචි කර ඇත.

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 434, නිකගොල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා සීමා ඇතුළත තිත්තවැලි ගම් දහය කෝරළේ, හිරියාල හත්පත්තුවේ, තිත්තවැල්ල ගමේ පිහිටි "කුඹුක් වැව එස්ටේට් *හෙවත්* අජ්මීර් ෆාම්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. එල්. සී. චන්ද්‍රරත්න විසින් 2020.10.25 වැනි දින පිළියෙල කරන ලද අංක 522 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 2 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : වඩුගම F.V.P. 2784 මගින් ද, නැගෙනහිරට : ඇළ නමුත් නඩා නිවැරදිව ලොට් 1 මගින් ද, දකුණට : ප්‍රාදේශීය සභා පාර මගින් ද සහ බස්නාහිරට : ඇළ නමුත් වඩා නිවැරදිව ලොට් 1 මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් දොළහයි දශම හතරක (පර්. 12.4) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N 253/118 යටතේ ලියාපදිංචි කර ඇත.

2023 ජූලි මස 28 වැනි දින.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්

02-809

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී. එල්. සී. - ගම්පොල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 2491375 සහ 2749418
දිසානායක මුදියන්සේලාගේ ඉන්දික රසික දිසානායක

2023 මාර්තු 28 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදි.

නුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. පී. බද්‍රා සිරිවර්ධන විසින් 2009 ඔක්තෝබර් 10 වැනි දින සහතික කරන ලද අංක 1449, නුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. පී. බද්‍රා සිරිවර්ධන විසින් 2010 අගෝස්තු 26 වැනි දින සහතික කරන ලද අංක 2053, නුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. පී. බද්‍රා සිරිවර්ධන විසින් 2011 ජූලි 20 වැනි දින සහතික කරන ලද අංක 2719, නුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. පී. බද්‍රා සිරිවර්ධන විසින් 2012 නොවැම්බර් 16 වැනි දින සහතික කරන ලද අංක 3726, නුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. පී. බද්‍රා සිරිවර්ධන විසින් 2013 දෙසැම්බර් 20 වැනි දින සහතික කරන ලද අංක 4228, ප්‍රසිද්ධ නොතාරිස් පී. එල්. නෙලුක ජයසිංහ විසින් 2014 නොවැම්බර් 18 වැනි දින සහතික කරන ලද අංක 2666, ප්‍රසිද්ධ නොතාරිස් පී. එල්. නෙලුක ජයසිංහ විසින් 2016 පෙබරවාරි 23 වැනි දින සහතික කරන ලද අංක 3059, ප්‍රසිද්ධ නොතාරිස් පී. එල්. නෙලුක ජයසිංහ විසින් 2018 අප්‍රේල් 05 වැනි දින සහතික කරන ලද අංක 3773 සහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එල්. නෙලුක ජයසිංහ විසින් 2018 සැප්තැම්බර් 05 වැනි දින සහතික කරන ලද අංක 3949 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද උකස් බැඳුම්කරයන් යටතේ (මෙහි පහත පළමුවන උපලේඛනයේ සහ/හෝ එකී උකස් බැඳුම්කරයන්ට අදාළ උපලේඛනවල සවිස්තරව විස්තර කරන ලද ඉඩම සම්බන්ධයෙන්) අයවිය යුතු මුදල් ගෙවීම දිසානායක

මුදියන්සේලාගේ ඉන්දික රසික දිසානායක ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්

නුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. වී. ඒ. ඩී. සී. කේ. විපුලසේන විසින් 2017 පෙබරවාරි 01 වැනි දින සහතික කරන ලද අංක 1985 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී නමට ලියන ලද්දා වූ එකී උකස් බැඳුම්කරය යටතේ (මෙහි පහත 2 වන උපලේඛනයේ සහ/හෝ එකී උකස් බැඳුම්කරයට අදාළ උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද) අය විය යුතු මුදල් ගෙවීම දිසානායක මුදියන්සේලාගේ ඉන්දික රසික දිසානායක ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්,

එකී බැඳුම්කරයන් යටතේ වෙනත් කරුණු අතර, රුපියල් මිලියන දාහතරයි පන් ලක්ෂ හැත්තෑ නව දහස් එකසිය විසි දෙකයි ශත අනූ එක (රු. 14,579,122.91) (කාලීන ණය අංක 2491375 සහ 2749418 හේතුවෙන් මුළු මුදල) ක මුදලක් 2023 පෙබරවාරි 7 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට දැන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන දාහතරයි පන් ලක්ෂ හැත්තෑ නව දහස් එකසිය විසි දෙකයි ශත අනූ එක (රු. 14,579,122.91) ක මුදල අය කර ගැනීම සඳහා සහ 2023 පෙබරවාරි 08 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 12,325,969.77 ක මුදලක් මත වර්ෂයකට 20% බැගින් වැඩිදුර පොළිය ද, සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 1449, 2053, 2719, 3726, 4228, 2666, 3059, 3773, 3949 සහ 1985 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස්කොට ඇත්තාවූ ද මෙහි පහත 1 වන සහ 2 වන උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය මහරගම, කටුවාවල පාරේ, අංක 30/83 දරන ස්ථානයේ සහ එසේම කොළඹ 12, හල්ෆ්ට්ස්ඩෝප් වීදියේ, 2 වන මහලේ, අංක 200 දරන ස්ථානයේ "ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්" යන නාමය, විලාසය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන, බලයලත් වෙන්දේසිකරුවන් වන, ලොකු බණ්ඩා සේනානායක, මගුරු දෙනියේ වලව්වේ ත්‍රිවංක චරිත් සේනානායක සහ ගුරුගේ සුමනාවතී සේනානායක යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### පළමුවන උපලේඛනය

1. මධ්‍යම පළාතේ, මහනුවර ආදායම් දිස්ත්‍රික්කයේ, ගම්පොළ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුලත ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමා තුළ ගම්පොලවෙල අංක 1077 දරන ග්‍රාම සේවක කොට්ඨාසයේ ගම්පොලවෙල පිහිටි "වීගුලවත්ත" ලෙස නම්කොට හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු, ටී. බී. එස්. සංගරදෙනිය විසින් 2009 ජුලි 15 වැනි දින පිළියෙල කරන ලද අංක 6400 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් A වශයෙන් දැක්වෙන ඉඩම් කොටස (බලයලත් මිනින්දෝරු, බී. එම්. එස්. බී. කරුණාරත්න විසින් 1996 මැයි 18 වැනි දින පිළියෙල කරන ලද අංක 2513 දරන පිඹුරේ දැක්වෙන ලොට් 2A ලකුණු කරන ලද ඉඩමේ නැවත මැනීමක් වන) තවද එකී අංක 6400 දරන පිඹුරේ දැක්වෙන ලොට් A ලකුණු කරන ලද ඉහත කී ඉඩමට මායිම් වශයෙන්, උතුරට : පී. එම්. රත්නායක විසින් හිමිකම්ලත් ඉඩමේ ඉතුරු කොටස වෙන්කරන ජීව වැට මගින් ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු, බී. එම්. එස්. බී. කරුණාරත්න විසින් පිළියෙල කරන ලද අංක 2513 දරන පිඹුරේ දැක්වෙන ලොට් 2B ලකුණු කරන ලද එම ඉඩමේ ඉතුරු කොටස මගින් ද දකුණට : ගම්පොල සිට මාලිගාපුරන දක්වා මග පෙන්වන නිවාස සිට U. C. පාර දක්වා මග පෙන්වන නාගරික සභා පාර මගින් ද සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු, බී. එම්. එස්. බී. කරුණාරත්න විසින් පිළියෙල කරන ලද අංක 2513 දරන පිඹුරේ දැක්වෙන ලොට් 3 ලකුණු කරන ලද එම ඉඩමේ ඉතුරු කොටසක් වෙන්කරන ජීව වැට මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් දාහතයි දශම හතරයි හය (පර්චස් 17.46) ක ඊට සමාන හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි හතරයි හතරයි දෙක (හෙක්ටෙයාර් 0.0442) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග එහි පිහිටි සියලු දේත් සමග අංක 6400 දරන පිඹුරේ ලකුණු කරන ලද නාගරික සභා පාර මතින් තුළ යටින් සහ ඔස්සේ මාර්ග අයිතිය සහ අනෙකුත් පොදු අයිතීන් සමග වන මෙය ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/ පත්‍රිරුව G31/121 යටතේ ලියාපදිංචි කර ඇත.

2. මධ්‍යම පළාතේ, නුවර ආදායම් දිස්ත්‍රික්කයේ, ගම්පොළ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, උඩ පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත උඩ පළාත, ප්‍රාදේශීය සභා සීමා තුළ උඩ පළාත, ගඟ ඉහළ කෝරළේ, ගම්පොලවෙල අංක 1077 දරන ග්‍රාම සේවක කොට්ඨාසයේ, ගම්පොලවෙල පිහිටි "වීගුලවත්ත" ලෙස නම්කොට හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු, බී. එම්. එස්. බී. කරුණාරත්න විසින් 1996 මාර්තු 26 වැනි දින පිළියෙල කරන ලද අංක 2513 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 7 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස ට මායිම් වශයෙන්, උතුරට : එම පිඹුරේ දැක්වෙන ලොට් 1, 2, සහ 3 මගින් ද, නැගෙනහිරට : ගම්පොල මාලිගාපුරන පාර මගින් ද, දකුණට : බී. ඩී. එස්. දි සිල්වා විසින් හිමිකම්ලත් ඉලුක්ගැටේ කුඹුර සහ බෙනට් විසින් හිමිකම්ලත් නැකැත් කුඹුර මගින් ද සහ බස්නාහිරට :

ඉහත කී අංක 2513 දරන පිඹුරේ දැක්වෙන ලොට් 5 සහ 6 මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් විසි එකයි දශම තුනයි හතර (පර්චස් 21.34) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග අංක 2513 දරන පිඹුරේ ලොට් 7 ලෙස ලකුණු කරන ලද නාගරික සභා පාර මතින් තුළ යටින් සහ ඔස්සේ මාර්ග අයිතිය සහ අනෙකුත් පොදු අයිතීන් සමග වන මෙය ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව G31/123 යටතේ ලියාපදිංචි කර ඇත.

## දෙවන උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවර දිස්ත්‍රික්කයේ, උඩ පළාත ගඟ පහළ කෝරළේ, කීරපනේ 1129 ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ උඩ පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත ගම්පොල නාගරික සභා සීමා ඇතුළත ගම්පොල කීරපනේ ගමේ පිහිටි "කඩුපනේ කුඹුර, ඬේලියැද්දේ කුඹුර, ඬේලියැද්ද සහ පිටමලියැද්දේ කුඹුර" ලෙස නම්කොට හඳුන්වනු ලබන ඉඩම් කොටසට බලයලත් මිනින්දෝරු, එස්. එම්. අබේරත්න විසින් 2009.06.22 වැනි දින පිළියෙල කරන ලද අංක 4191 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 2 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, ඊසානට : පාර වෙන් කරන පෙදරේරුවම් කාණුව මගින් ද, ගිණිකොණට : ඉතුරු කොටස වෙන්කරන පෙදරේරුවම් කාණුව මගින් ද, නිරිතට : ලොට් 19 ලකුණු කරන ලද පෙදරේරුවම් කාණුව මගින් ද, සහ වයඹට : එම පිඹුරේ ලොට් 1 මගින් ද මායිම් වූ එකී පිඹුර ප්‍රකාරව පර්චස් තුනයි දශම එකයි පහ (පර්චස් 3.15)ක හෙවත් හෙක්ටෙයාර් 0.00796 ක විශාලත්වයෙන් වූ ඉඩම සමග වරිපනම් අංක 8/10 දරන ගොඩනැගිල්ල සමග සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව E65/17 යටතේ ලියාපදිංචි කර ඇත.

2023 මාර්තු මස 28 වැනි දින.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

02-814

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - නුවරඑළිය ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය : 2657521, 3059469, 3059510 සහ 2849080
කලෙයිකුමාර් ප්‍රදීපන්

2023 ක් වූ දෙසැම්බර් මස 20 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කරගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. වී. ඒ. ඩී. සී. කේ. විපුලසේන විසින් සියල්ලම ලියා සහතික කරන ලද 2018 මැයි 23 වැනි දිනැති අංක 2343 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමින් වූ බැඳුම්කරය යටතේ අංක 162, වජිරපුර, නුවර එළිය දරන ලිපිනයේ පදිංචි කලෙයිකුමාර් ප්‍රදීපන් නැමැති අය උකස්කරු වශයෙන් මෙහි පළමුවන උපලේඛනයේ වඩාත් විස්තර කර ඇති දේපළ අංක 2343 දරන බැඳුම්කරය මගින් කලෙයිකුමාර් ප්‍රදීපන් නැමැති අය විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. වී. ඒ. ඩී. සී. කේ. විපුලසේන විසින් සියල්ලම ලියා සහතික කරන ලද 2019 අප්‍රේල් 18 වැනි දිනැති අංක 2591 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමින් වූ බැඳුම්කරය යටතේ කලෙයිකුමාර් ප්‍රදීපන් නැමැති අය බන්ධනදායී වශයෙන් මෙහි දෙවන උපලේඛනයේ වඩාත් විස්තර කර ඇති දේපළ අංක 2343 දරන බැඳුම්කරය මගින් කලෙයිකුමාර් ප්‍රදීපන් නැමැති අය විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී.එල්.සී. වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස් අට මිලියන නව ලක්ෂ හත් දහස් තුන්සිය දහඅටයි ශත හතළිස් හයක (රු. 58,907,318.46) මුදලක් 2023 ඔක්තෝබර් මස 27 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් පනස් අට මිලියන නව ලක්ෂ හත් දහස් තුන්සිය දහඅටයි ශත හතළිස් හයක (රු. 58,907,318.46) මුදල ප්‍රතිනිර්මාණය කරන ලද ණය ගිණුම් අංක 2657521, 3059469, 3059510 සහ කාලීන ණය අංක 2849080 හි ප්‍රාග්ධන මුදලින් කොටසක් සම්බන්ධයෙන් එම බැඳුම්කර මත හා විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සහ වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවා ද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩු කර අය කර ගැනීම සඳහා එකී අංක 2343 සහ 2591 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත පළමුවන සහ දෙවන උපලේඛනවල වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රයන් මහනුවර, මාවිල්මඩ, දුටුගැමුණු මාවතේ, අංක 369/1 හි බලයලත් වෙන්දේසිකාර "ජයසූරිය ඇන්ඩ් ජයසූරිය ඔක්ෂනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" විසින් ප්‍රසිද්ධ

වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ පැවරි ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කරනු ලැබේ.

(අ). ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 2657521 යටතේ 2023 ඔක්තෝබර් මස 27 වැනි දින වන විට රු. 44,223,593.83ක මුදල සහ 2023 ඔක්තෝබර් මස 28 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 39,318,000.00ක මුදලක් සඳහා වාර්ෂිකව 18.00% බැගින් වූ වැඩිදුර පොළිය ද,

(ආ) ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 3059469 යටතේ 2023 ඔක්තෝබර් මස 27 වැනි දින වන විට රු. 6,479,757.89ක මුදල සහ 2023 ඔක්තෝබර් මස 28 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 5,794,440.00 මුදලක් සඳහා වාර්ෂිකව 18.00% බැගින් වූ වැඩිදුර පොළිය ද,

(ඇ). ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 3059510 යටතේ 2023 ඔක්තෝබර් මස 27 වැනි දින වන විට රු. 6,039,622.74ක මුදල සහ 2023 ඔක්තෝබර් මස 28 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 5,598,216.00ක මුදලක් සඳහා වාර්ෂිකව 12.00% බැගින් වූ වැඩිදුර පොළිය ද,

(ඈ) ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 2849080 යටතේ 2023 ඔක්තෝබර් මස 27 වැනි දින වන විට ප්‍රාග්ධනයේ කොටසක් වන රු. 2,164,344.00ක මුදල සහ 2023 ඔක්තෝබර් මස 28 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 2,164,344.00ක මුදලක් සඳහා වාර්ෂිකව 8.5% බැගින් වූ වැඩිදුර පොළිය ද වේ.

### පළමුවන උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, ඔයපළාත කෝරළේ, නුවරඑළිය නගර සභා දූනට මහනගර සභා සීමාව තුළ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හාවාඑළිය හි අංක 535 - 1 බුළුඇළ ග්‍රාම නිලධාරි වසම බැරැක් ප්ලෙයින් හි පිහිටි "හාවා එළිය පතන" නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. ලියනගේ මහතා විසින් මැන සාදන ලද 2011.03.31 වැනි දිනැති අංක 505 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද ඉඩමට මායිම්, උතුරට : ප්‍රධාන මාර්ග රක්ෂිතය අංක 07/121 දරන පිඹුරේ නිරූපිත ලොට් 02 හි කොටසක් සහ අංක 07/121 දරන පිඹුරේ නිරූපිත ලොට් 01, නැගෙනහිරට : මාර්ගය, දකුණට : අංක 07/121 දරන පිඹුරේ නිරූපිත ලොට් 02 හි කොටසක් සහ බටහිරට : බලයලත් මිනින්දෝරු ෂන්මුගලිංගම් විසින් මැන සාදන ලද 1906.04.25 දිනැති පිඹුරේ ලොට් 1 සහ අංක 02/121 දරන පිඹුරේ නිරූපිත ලොට් 02 හි කොටසක් යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් විස්සක් (රූ. 02, පර්. 20) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සෑම සියලු දේත් සමග වේ. මෙය නුවර එළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ47/247 වෙළුම/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

මෑතක දී කරන ලද මිනුමකට අනුව ඉහත කී ලොට් 1 පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, ඔයපළාත කෝරළේ, නුවරඑළිය නගර සභා දූනට මහනගර සභා සීමාව තුළ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හාවාඑළිය හි අංක 535 - 1 බුළුඇළ ග්‍රාම නිලධාරි වසම බැරැක් ප්ලෙයින් හි පිහිටි උඩපුස්සැල්ලාව පාර, වරිපනම් අංක 216 හි කොටසක් වන "හාවා එළිය පතන" නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු යූ. එන්. පී. විජේවීර මහතා විසින් මැන සාදන ලද අංක 3994 N දරන පිඹුරේ නිරූපිත ලොට් 01 හි අනුබෙදුම වන බලයලත් මිනින්දෝරු නිමල් ලියනගේ මහතා විසින් මැන සාදන ලද 2015.06.26 දිනැති අංක 1379 දරන පිඹුරේ නිරූපිත ලොට් 3 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : උඩුපුස්සැල්ලාව පාර සහ අංක 1379 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 සහ 2, නැගෙනහිරට : මාර්ගය, දකුණට : අංක 1379 පිඹුරේ ලොට් 4 සහ බටහිරට : බලයලත් මිනින්දෝරු ෂන්මුගලිංගම් මහතා විසින් මැන සාදන ලද 1906.04.25 වැනි දිනැති පිඹුරේ නිරූපිත ලොට් 1 යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් විස්සක් (රූ.02, පර්. 20) *හෙවත්* හෙක්ටයාර 0.2528ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සෑම සියලුදේත් සමග වේ.

### දෙවන උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහනගර සභා සීමාව තුළ මහනුවර ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, වටපුළුව ග්‍රාම නිලධාරි වසමේ කොට්ඨාස අංක 11, වටපුළුව හි පිහිටි "වටපුළුව වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සරත් කැකුලන්දර මහතා විසින් මැන සාදන ලද 1995.08.07 දිනැති අංක 731 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරටඃ සර්වේයර් ජෙනරාල් විසින් සහතික කරන ලද 1969.07.24 දිනැති අංක පී පී මහ 508 දරන පිඹුරේ ලොට් 284, නැගෙනහිරට : ප්‍රීති මාවත, දකුණට : ලොට් 3 (මාර්ග රක්ෂිතය) සහ බටහිරට : ලොට් 2 යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විසිහයයි දශම අටයි හතක් (පර්. 26.87) *හෙවත්* හෙක්ටයාර 0.0680ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි වරිපනම් අංක 4, ප්‍රීති මාවත, වටපුළුව, මහනුවර දරන නිවස සහ සෑම සියලුදේත් සමග වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ368/252 වෙළුම/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

මෑතකදී කරන ලද මිනුමකට අනුව ඉහත කී ලොට් 1 පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහනගර සභා සීමාව තුළ මහනුවර ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, වටපුළුව ග්‍රාම නිලධාරි වසමේ කොට්ඨාස අංක 11, වටපුළුව (මහවැලි උයන) හි පිහිටි "වටපුළුව වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඒ. දිසානායක මහතා විසින් මැන සාදන ලද 2004.09.28 දිනැති අංක 241 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසානට : ප්‍රීති මාවත, දකුණට : වටපුළුව වත්ත හි (කොටසක්) වෙන්වන පිඹුරු අංක 731 හි ලොට් 3, පී පී මහ 508 හි ලොට් 279, නිරිතට : බලයලත් මිනින්දෝරු සරත් කැකුළන්දර විසින් සාදන ලද අංක 731 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 (පී පී මහ 508 හි ලොට් 283 හි කොටසක්), වයඹට : තිසේරා මහත්මිය විසින් හිමිකම්පාන වරිපනම් අංක 2ඒ වටපුළුව වත්ත හි (කොටසක්) පී පී මහ 508 හි ලොට් 284 යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විසිහයයි දශම අටයි හතක් (පර්. 26.87) *හෙවත්* හෙක්ටයාර් 0.0680ක් විශාල ඉඩම සහ එහි පිහිටි වරිපනම් අංක 4, ප්‍රීති මාවත, වටපුළුව, මහනුවර දරන නිවස සහ සැම සියලුදේත් සමග වේ.

2023 දෙසැම්බර් මස 20 වැනි දින.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්

02-780

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී. එල්. සී. - මොරටුව ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 2900931
සයක්කාරගේ ශාමින්ද අසේල ප්‍රනාන්දු

2023 ඔක්තෝබර් 25 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. පී. එස්. ජයවීර විසින් 2021 මාර්තු මස 17 වැනි දින සහතික කරන ලද අංක 4278 දරන උකස් බැඳුම්කරය මගින් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම හා පරිශ්‍රය උකස් කොට බැඳ දමා ඇති කැස්බෑව, මඩපාත, කහපොල පාරේ, අංක 33/05 දරන ස්ථානයේ සහ එසේම මොරටුව, රාවතාවත්ත, පොල්කොටුව පාරේ, අංක 30 දරන ස්ථානයේ, සයක්කාරගේ ශාමින්ද අසේල ප්‍රනාන්දු ණයකරු හැටියට සහ ඉහත කී පහසුකම නැවත ගෙවීම සඳහා ඇපයක් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද එකී උකස් බැඳුම්කර අංක 4278 මත අයවිය යුතු මුදල් ගෙවීම එකී සයක්කාරගේ ශාමින්ද අසේල ප්‍රනාන්දු පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස් බැඳුම්කරය අංක 4278 යටතේ ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 2900931 සම්බන්ධයෙන් වෙනත් කරුණු අතර, රුපියල් මිලියන හතයි පන් ලක්ෂ විසි හය දහස් හයසිය හැට පහයි ශත පනස් නවයක (රු. 7,526,665.59) මුළු මුදලක් 2023 අගෝස්තු මස 23 දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට දැන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන හතයි පන් ලක්ෂ විසි හය දහස් හයසිය හැට පහයි ශත පනස් නවයක (රු. 7,526,665.59ක) මුදල අය කර ගැනීම සඳහා සහ 2023 අගෝස්තු මස 24 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 6,776,308.92ක ඉතුරු මුල් මුදල මත එකී ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 2900931 මත වර්ෂයකට 12.50% බැගින් වැඩිපුර පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ ද යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 4278 දරන උකස් බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස්කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද ඉඩම හා පරිශ්‍රය මහරගම කටුවාවල පාරේ, අංක 30/83 දරන ස්ථානයේ සහ එසේම කොළඹ 12, හල්ෆ්ට්ස්ඩෝප් වීදියේ, 2 වන මහලේ, අංක 200 දරන ස්ථානයේ "ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්" යන නාමය, විලාසය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන, බලයලත් වෙන්දේසිකරුවන් වන, ලොකු බණ්ඩා සේනානායක, මගුරු දෙනියේ වලව්වේ ත්‍රිවංක චරිත් සේනානායක සහ ගුරුගේ සුමනාවතී සේනානායක යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කරනු ලබයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ කැස්බෑව නාගරික සභා සීමා ඇතුළත, අංක 567, මඩපාත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මඩපාත ගමේ පිහිටි "හෙට්ටිමුල්ලේ ඕවිට *හෙවත්* අඹගහඕවිට" වර්තමානයේ "හෙට්ටිමුල්ලේවත්ත *හෙවත්* අඹගහවත්ත ලෙස හඳුන්වන" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. කේ. මාතරච්චි විසින් 2008.05.29 වැනි දින පිළියෙල කරන ලද අංක 0424 දරන

පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 2 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : අංක 0417 දරන පිඹුරේ ලොට් A මගින් ද, නැගෙනහිරට : ලොට් 3 මගින් ද, දකුණට : ලොට් R1 මගින් ද සහ බස්නාහිරට : ලොට් 1 මගින් ද මායිම් වූ එකී අංක 0424 දරන පිඹුර ප්‍රකාරව පර්චස් අටයි දශම බිංදුව (පර්. 08.0ක) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව C 852/130 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 0424 දරන පිඹුරේ ලොට් R1, R2 සහ R3 මතින් සහ ඔස්සේ මාර්ග අයිතිය භාවිතයට ඇති අයිතිය සමග වේ.

2023 ඔක්තෝබර් මස 25 වැනි දින.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්

02-810

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - නිට්ටඹුව ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 2952024 සහ 2952028
"පතිරාජ ට්‍රේඩර්ස්"

2023 සැප්තැම්බර් මස 26 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදි.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. එස්. ඩී. මුණසිංහ විසින් 2018 ජූනි මස 06 වැනි දින සහතික කරන ලද අංක 1514 දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම හා පරිශ්‍රය උකස් කොට බැඳ දමා ඇති නිට්ටඹුව, කන්දහේන පාර, අංක 562/230 දරන ස්ථානයේ "පතිරාජ ට්‍රේඩර්ස්" යන නාමය විලාසය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යන නිට්ටඹුව, කන්දහේන පාර, අංක 562/230 දරන ස්ථානයේ සිරිවර්ධන පතිරාජපක්ෂ මුදියන්සේලාගේ චන්දන ජයනාත් පතිරාජ ණයකරු හැටියට සහ ඉහත කී පහසුකම නැවත ගෙවීම සඳහා ඇපයක් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද එකී බැඳුම්කර අංක 1514 මත අයවිය යුතු මුදල් ගෙවීම එකී සිරිවර්ධන පතිරාජපක්ෂ මුදියන්සේලාගේ චන්දන ජයනාත් පතිරාජ පැහැර හැර ඇති හෙයින්,

සහ ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඩී. වී. ජේ. එන්. ගුණවර්ධන විසින් 2018 ජූනි මස 06 වැනි දින සහතික කරන ලද අංක 34 දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම හා පරිශ්‍රය උකස් කොට බැඳ දමා ඇති "පතිරාජ ට්‍රේඩර්ස්" යන නාමය විලාසය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යන එකී සිරිවර්ධන පතිරාජපක්ෂ මුදියන්සේලාගේ චන්දන ජයනාත් පතිරාජ ණයකරු හැටියට සහ ඉහත කී පහසුකම නැවත ගෙවීම සඳහා ඇපයක් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද එකී බැඳුම්කර අංක 34 මත අයවිය යුතු මුදල් ගෙවීම සිරිවර්ධන පතිරාජපක්ෂ මුදියන්සේලාගේ චන්දන ජයනාත් පතිරාජ පැහැර හැර ඇති හෙයින්

සහ කාලීන ණය අංක 2952028 සම්බන්ධයෙන් දිය යුතු මුල් මුදල සහ පොළිය සහ කාලීන ණය අංක 2952024 සම්බන්ධයෙන් හිඟව තිබෙන මුල් මුදලේ කොටස හේතුවෙන් එකී බැඳුම්කරයන් යටතේ මෙහි පහත පෙන්වන පරිදි වැඩිදුර පොළිය සමග, වෙනත් කරුණු අතර, රුපියල් මිලියන විසි හයයි හය ලක්ෂ අනූ දහස් එකසිය පහයි ශත පනස් පහ (රු. 26,690,105.55) ක මුදලක් 2023 අගෝස්තු 09 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට දැන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන විසි හයයි හය ලක්ෂ අනූ දහස් එකසිය පහයි ශත පනස් පහ (රු. 26,690,105.55) ක මුදල අය කර ගැනීම සඳහා සහ මෙහි පහත පෙන්වන පරිදි වැඩිදුර පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 1514 සහ 34 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල් සී හට උකස්කොට ඇත්තාවූ ද මෙහි පහත පළමුවන සහ දෙවන උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තාවූද ඉඩම හා පරිශ්‍රය මහරගම, කටුවාවල පාරේ, අංක 30/83 දරන ස්ථානයේ සහ එසේම කොළඹ 12, හල්ෆ්ට්ස්ඩෝප් වීදියේ, 2 වන මහලේ, අංක 200 දරන ස්ථානයේ "ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්" යන නාමය, විලාසය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන, බලයලත් වෙන්දේසිකරුවන් වන, ලොකු බණ්ඩා සේනානායක, මගුරු දෙනියේ වලව්වේ ත්‍රිවංක චරිත් සේනානායක සහ ගුරුගේ සුමනාවතී සේනානායක යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

(a) විකිණීමේ දිනය දක්වා කාලයට 2023 අගෝස්තු මස 10 වැනි දිනට සිට රු. 8,200,000.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 28% බැගින් වැඩිදුර වාර්ෂික පොලිය ද සහිතව 2023 අගෝස්තු 09 දින වන විට රු. 10,390,105.55 ක මුළු මුදලක කාලීන ණය අංක 2952028 සම්බන්ධයෙන් සහ

(b) විකිණීමේ දිනය දක්වා කාලයට 2023 අගෝස්තු 10 වැනි දින සිට රු. 16,300,000.00 ක එකී මුදල මත වර්ෂයකට 28% බැගින් වැඩිදුර වාර්ෂික පොලිය ද සහිතව 2023 අගෝස්තු මස 09 දින වන විට රු. 16,300,000.00 ක මුදලක් කාලීන ණය අංක 2952024 සම්බන්ධයෙන්

### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, මීරිගම ප්‍රාදේශීය සභා සීමා ඇතුළත මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාදුරුපිටිය, 11 ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත මාදුරුපිටිය ගමේ පිහිටි කහටගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, ඊ. ඩබ්. කරුණාසේකර විසින් 2000.10.22 වැනි දින පිළියෙල කරන ලද අංක 2496 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 11B2 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මංචනායක විසින් හිමිකම්ලත් ඉඩම සහ පාසල විසින් හිමිකම්ලත් ඉඩම මගින් ද, නැගෙනහිරට : අංක 255 දරන පිඹුරේ ලොට් 11C මගින් ද, දකුණට : පාර මගින් ද, බස්නාහිරට : ලොට් 11B1 මගින් ද, මායිම් වූ එකී අංක 2496 දරන පිඹුර ප්‍රකාරව රූඩ් දෙක (රූ. 02) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ඉහත කී ලොට් 1 පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමක් වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, මීරිගම ප්‍රාදේශීය සභා සීමා ඇතුළත මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාදුරුපිටිය, 11 ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත මාදුරුපිටිය ගමේ පිහිටි කහටගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, ඊ. ඩබ්. කරුණාසේකර විසින් පිළියෙල කරන ලද අංක 256 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 11B2 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මංචනායක විසින් හිමිකම්ලත් ඉඩම සහ පාසල විසින් හිමිකම්ලත් ඉඩම මගින් ද, නැගෙනහිරට : අංක 255 දරන පිඹුරේ ලොට් 11C මගින් ද, දකුණට : පාර මගින් ද, බස්නාහිරට : ලොට් 11B1 මගින් ද, මායිම් වූ එකී අංක 256 දරන පිඹුර ප්‍රකාරව රූඩ් දෙක (රූ.02) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව F 339/74 යටතේ ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩුගහ පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමා සහ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත නම්බාදලුව නැගෙනහිර කොට්ඨාසය අංක 348/G, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නිට්ටඹුව පිහිටි "කන්දගේන වත්ත එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, වරුණ අජන්ත යාපා විසින් 2014.11.16 වැනි දින පිළියෙල කරන ලද අංක 5055 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට: අංක 3070 දරන පිඹුරේ ලොට් D සහ C මගින් ද නැගෙනහිරට: පාර මගින් ද, දකුණට : ප්‍රාදේශීය සභා පාර මගින් ද සහ බස්නාහිරට : පාර මගින් ද මායිම් වූ එකී අංක 5055 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තිහ (පර්චස් 30) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිට සියලු දේත් සමග වේ.

ඉහත ඉඩම පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමක් වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩුගහ පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමා සහ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත නම්බාදලුව නැගෙනහිර කොට්ඨාසය අංක 348/G, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නිට්ටඹුව පිහිටි "කන්දගේන වත්ත එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, ආර්. ඒ. චන්ද්‍රරත්න විසින් 2006.12.20 වැනි දින පිළියෙල කරන ලද අංක 3070 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් E වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට: මෙහි ලොට් D සහ C මගින් ද නැගෙනහිරට : පාර මගින් ද, දකුණට : ගම් සභා පාර මගින් ද සහ බස්නාහිරට : පාර මගින් ද මායිම් වූ එකී අංක 3070 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තිහ (පර්. 30) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලුදේත් සමග වන මෙය අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව යටතේ B 184/88 හි ලියාපදිංචි කර ඇත.

2023 සැප්තැම්බර් මස 26 වැනි දින.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

02-808

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී. එල්. සී. - නාවල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 2834483
අහන්ගම විතානගේ දර්ශන ජයලත් අබේගුණසේකර

2023 දෙසැම්බර් මස 20 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. පී. එස්. ජයවීර විසින් 2021.12.09 වැනි දින සහතික කරන ලද අංක 4449 දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම හා පරිශ්‍රය උකස් කොට බැඳ දමා ඇති හෝමාගම, අතුරුගිරිය පාරේ, පළමුවන පටුමගේ, අංක 220/1 දරන ස්ථානයේ අහන්ගම විතානගේ දර්ශන ජයලත් අබේගුණසේකර ණයකරු හැටියට සහ ඉහත කී පහසුකම නැවත ගෙවීම සඳහා ඇපයක් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ එකී උකස් බැඳුම්කර අංක 4449 මත අයවිය යුතු මුදල් ගෙවීම එකී අහන්ගම විතානගේ දර්ශන ජයලත් අබේගුණසේකර යන අය පැහැර හැර ඇති හෙයින්,

සහ නිවහන නිවාස ණය අංක 2834483 සම්බන්ධයෙන් එකී උකස් බැඳුම්කරය යටතේ, වෙනත් කරුණු අතර, රුපියල් මිලියන හයයි දෙලක්ෂ අසූ එක් දහස් හත්සිය දොළහයි ශත හැත්තෑ දෙකක (රු. 6,281,712.72)ක මුළු මුදලක් 2023 ඔක්තෝබර් 20 දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට දැන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන හයයි දෙලක්‍ෂ අසූ එක් දහස් හත්සිය දොළහයි ශත හැත්තෑ දෙකක (රු. 6,281,712.72) මුදල අයකර ගැනීම සඳහා සහ 2023 ඔක්තෝබර් 21 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට එකී නිවහන නිවාස ණය අංක 2834483 සම්බන්ධයෙන් රු. 5,500,000.00ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 9.5% බැගින් වැඩිදුර පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 4449 දරන උකස් බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හට උකස්කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද ඉඩම හා පරිශ්‍රය කොළඹ 08, බොරැල්ල, පෙලෙන්ගස්තුඩුව පාරේ, අංක 109/21 දරන ස්ථානයේ අරච්චාවල සුසිලා කුමාරි යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, කුඹුකේ පත්තුවේ, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ හොරණ ප්‍රාදේශීය සභා සීමා තුළ උඩුව දකුණ අංක 614/A , ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ උඩුව හි පිහිටි "වාද්දුවහේන (යහලකැළේ ගෲප්)" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ඒ. ධර්මසිරි විසින් 2013.02.02 වැනි දින පිළියෙල කරන ලද අංක 5514 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 6 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 7 මගින් ද, නැගෙනහිරට : ලොට් 5 මගින් ද, දකුණට : අංක 5512 දරන පිඹුරේ ලොට් 18 මගින් ද (මීටර් 6.0 පළල පාර) සහ බස්නාහිරට : ලොට් 13 මගින් ද (මීටර් 4.5 පළල පාරට වෙන්කිරීම) මායිම් වූ එකී අංක 5514 දරන පිඹුර ප්‍රකාරව පර්චස් එකොළහයි දශම එකක (පර්. 11.1) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමගවන මෙය හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A 284/46 යටතේ ලියාපදිංචි කර ඇත.

2013.02.02 වැනි දින එකී අංක 5514 දරන පිඹුරේ සියලු පාරවල් සහ ඔස්සේ මාර්ග අයිතිය භාවිතයට ඇති අයිතිය සමග වේ.

2023 දෙසැම්බර් මස 20 වැනි දින.

ආර්. ඒ. පී. රාජපක්‍ෂ,
සමාගම් ලේකම්.

02-778

---

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥපනතේ (397 අධිකාරය) 21 වන වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2023.12.04 දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. ආර්. එන්. එල්. ගුණතිලක විසින් සහතික කරන ලද 2017.07.13 දිනැති අංක 550 දරන උකස් බැඳුම්කරය, ප්‍රසිද්ධ නොතාරිස් ටී. කේ. එස්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද 2019.06.04 දිනැති අංක 725 දරන අතිරේක උකස් බැඳුම්කරය, අනුව 2023.10.12 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 9,565,351.49ක (රුපියල් අනූපන් ලක්ෂ හැටපන් දහස් තුන්සිය පනස් එකයි ශත හතළිස් නවයක්) මුදලක් සමග රු. 5,900,000.00 (රුපියල් පනස් නව ලක්ෂයක්) මත වසරකට සියයට විසිපහයි දශම දෙකයි පහක් (25.25%) බැගින් 2023.10.13 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, ගල්ගමුව, ආතරගල්ල, අලුත්කොටස, අංක 05/1 හි බෙන්තර අප්පුහාමිලාගේ ගයාන් මංජුල අබේසිංහ මහතා වෙතින් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. ආර්. එන්. එල්. ගුණතිලක විසින් සහතික කරන ලද 2017.07.13 දිනැති අංක 550 දරන උකස් බැඳුම්කරය, ප්‍රසිද්ධ නොතාරිස් ටී. කේ. එස්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද 2019.06.04 දිනැති අංක 725 දරන අතිරේක උකස් බැඳුම්කරය, අනුව 2023.10.12 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 9,565,351.49ක (රුපියල් අනූපන් ලක්ෂ හැටපන් දහස් තුන්සිය පනස් එකයි ශත හතළිස් නවයක්) මුදලක් සමග රු. 5,900,000.00 (රුපියල් පනස් නව ලක්ෂයක්) මත වසරකට සියයට විසිපහයි දශම දෙකයි පහක් (22.25%) බැගින් 2023.10.13 දින සිට විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය ද ලංකා බැංකු ආඥපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3, T&H ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර M. H. T. කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, අඹන්පොල ශාඛාවේ කළමනාකාර මහතත්මිය හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### පළමු උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වන්නි හත්පත්තුවේ, නැගෙනහිර හතලිස්පහ කෝරළේ, ගල්ගමුව ප්‍රාදේශීය සභා සීමාවේ, ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇරියාව - අංක 129 දරන ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාසයේ, හේනේගෙදර ග්‍රාමයේ පිහිටි "වැව්ඉහළ යාය, වාන්කොනහේන, ඇලපැත්තේයාය, වාන්කොනයාය, වැව්ඉහලහේන" නමැති ඉඩම බලයලත් මිනින්දෝරු බී. ජී. බන්දුතිලක විසින් සාදන ලද 2015.08.20 දිනැති අංක 15015/2015 දරන පිඹුරේ නමුත් 2015.08.10 ලෙස ලියාපදිංචි කර ඇති මායිම් නිරූපණය කර ලොට් අංක 02 ලෙස ලකුණු කර බෙදන ලද්දා වූ එකී ලොට් 02, උතුරට : එච්. එම්. මුතුබණ්ඩා හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : බණ්ඩාරනායක හිමිකම් කියන ඉඩම ද, දකුණට : ප්‍රධාන පාරේ සිට හේනේගෙදර වැව දක්වා පාර ද, බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටසද, මායිම්ව අක්කර එකක (අ.01) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සමග එහි පිහිටි ගහකොළ, වැවිලි, ගොඩනැගිලි ඇතුලු සියලු දේ සමග වේ. මෙම ඉඩම නිකවැරටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO නික/ඇහැ/13/70 හි ලියාපදිංචි කර ඇත.

*වෙන් කිරීම* :

1. සියලු ඛනිජ (ඔප්පුවේ මෙම යෙදුමට වටිනා ගල් ද ඇතුළත් වේ.) පිළිබඳව හිමිකම සහ ඒවා හැරීම සෙවීම ඒ සම්බන්ධව වැඩ කිරීම සහ එවැනි ඛනිජ බැහැර කිරීම යනාදී අයිතීන් රජය සතුය.

2. මෙම ඉඩමට අයිතිකරුවන් සතු හිමිකම වන්නේ මෙම ප්‍රදානයේ දිනයේ සිට පාරේ අයිතිය හා පවත්නා වෙනත් පරවශ්‍යතාවන්ට යටත්වේ.

*කොන්දේසි* :

1. අයිතිකරු විසින් ගොඩ ඉඩමෙන් මෙහි නිශ්චිතව දක්වා ඇති අක්කර/හෙක්ටෙයාර 1/4ක්, මඩ ඉඩමෙන් අක්කර/හෙක්ටයාර් .......... කට වඩා අඩු උප බෙදුම් ඒකකයන් බැහැර නොකළ යුතු ය.

2. අයිතිකරු විසින් මෙහි අක්කර 1/4 ලෙස නම් කොට නිශ්චිතව දක්වා ඇති ඉඩම් කොටසට වඩා අඩු නොබෙදූ කොටසක් බැහැර නොකළ යුතු ය.

3. කිසිවෙකුට ඉහත කොන්දේසි 1 හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු බෙදන ලද කොටසට අයිතිකරුවකු විය නොහැක.

4. කිසිවකුට ඉහත කොන්දේසි 2 හි නිශ්චිතව දක්වා ඇති උප බෙදුම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු අවම නොබෙදූ කොටසක අයිතිකරුවකු විය නොහැක.

5 ඉඩමට හෝ එහි කිසියම් කොටසකට ජලය සැපයිය හැකි නම් හෝ දැනටමත් ඉදිකර ඇති යම් වාරිමාර්ග කාර්යයන් ඉදිකිරීමක් හෝ ඉදිකිරීමට ඇති යමක් හේතුවෙන් ජලය සැපයිය හැකි බවට පත්වන්නේ නම් හෝ එම ජලය සැපයිය හැකි ප්‍රදේශය සම්බන්ධයෙන් අයිතිකරු වාරිමාර්ග ආඥපනතේ (453 වගන්තිය) ඇති ප්‍රතිපාදනවලට අනුකූලව කටයුතු කළ යුතු ය.

6. දිසාපතිගෙන් ලිඛිත අවසරයක් සහ අදාළ අධිකාරිගෙන් බලපත්‍රයක් ලබා නොගෙන එම ඉඩම මත හෝ ඒ තුළ ඇති කිසිදු ඛනිජ ද්‍රව්‍යයක් හැරීම, සෙවීම භාවිතයට ගැනීම විකිණීම හෝ අන් ආකාරයෙන් බැහැර කිරීම අයිතිකරු විසින් නොකළ යුතු ය.

7. ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ව අනුමැතිය ලිඛිතව ලබා නොගෙන මෙම ඉඩම හෝ එහි ඕනෑම කොටසක් බැහැර නොකළ යුතු ය.

**දෙවන උපලේඛනය**

| *Machinery Type* | *Serial No.* | *No. of Units* | *Price (Rs.)* |
|---|---|---|---|
| MLNT 25 Rice Huller | 002057333 | 2 | 990,000.00 |
| Separator | EMG18033 | 1 | 329,000.00 |
| M.M. 11 Polisher | ES129352 | 2 | 170,000.00 |
| DASS Stoner Complete | TE166061930 | 1 | 225,000.00 |
| Bag Closer | | 1 | 18,000.00 |
| Elevator | | 222 feats | 1,110,000.00 |
| 20HP Motors | E129352/ E129362 | 2 | 175,000.00 |
| 1HP Motors | | 9 | 180,000.00 |
| 3HP Motors | JBTI10391 | 2 | 46,000.00 |
| BLOWER | | 1 | 75,000.00 |
| STOCK TANKS | | 2 | 130,000.00 |
| **TOTAL** | | | **3,448,000.00** |

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. කේ. පී. ජයතිලක මයා,
කළමනාකරු.

ලංකා බැංකුව,
අඹන්පොල ශාඛාව.

02-799

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වන වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2023.12.04 පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. කේ. එස්. එම්. රත්නායක විසින් සහතික කරන ලද 2016.03.30 දිනැති අංක 3923 දරන උකස් බැඳුම්කරය, ප්‍රසිද්ධ නොතාරිස් ආර්. සී. කේ. ජයවීර විසින් සහතික කරන ලද 2016.11.11 දිනැති අංක 130 දරන උකස් බැඳුම්කරය සහ 2018.03.13 දිනැති අංක 256 දරන උකස් බැඳුම්කරය අනුව 1 වන ණය මත 2023.10.27 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 12,208,519.25 ක (රුපියල් එක් කෝටි විසිදෙලක්ෂ අට දහස් පන්සිය දහනවයයි ශත විසිපහක්) මුදලක් සමග රු. 8,215,866.15 (අසූදෙලක්ෂ පහළොස් දහස් අටසිය හැටහයයි ශත පහළොවක්) මත වසරකට සියයට පහළොවයි දශම පහයි බිංදුවක් (15.50%) බැගින් 2023.10.28 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, 2 වන ණය මත 2023.10.27 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 961,083.60ක (රුපියල් නව ලක්ෂ හැට එක් දහස් අසූතුනයි ශත හැටක්) මුදලක් සමග රු. 590,745.23 (රුපියල් පන්ලක්ෂ අනූ දහස් හත්සිය හතළිස් පහයි ශත විසිතුනක්) මත වසරකට සියයට විසිපහයි දශම දෙකයි පහක් (25.25%) බැගින් 2023.10.28 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, දඹදෙනිය, සිරිගල, බංගලාවත්ත හි අදිකාරි පතිරන්නැහැලාගේ ලසන්ත සම්පත් අදිකාරි මහතා සහ කාරියවසම් අබේපුස්සගේ ගයානි මහේෂිකා මහත්මිය යන අය වෙතින් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. කේ. එස්. එම්. රත්නායක විසින් සහතික කරන ලද 2016.03.30 දිනැති අංක 3923 දරන උකස් බැඳුම්කරය, ප්‍රසිද්ධ නොතාරිස් ආර්. සී. කේ. ජයවීර විසින් සහතික කරන ලද 2016.11.11 දිනැති අංක 130 දරන උකස් බැඳුම්කරය සහ 2018.03.13 දිනැති අංක 256 දරන උකස් බැඳුම්කරය අනුව 1 වන ණය මත 2023.10.27 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 12,208,519.25 ක (රුපියල් එක් කෝටි විසිදෙලක්ෂ අට දහස් පන්සිය දහනවයයි ශත විසිපහක්) මුදලක් සමග රු. 8,215,866.15 (රුපියල් අසූදෙලක්ෂ පහළොස් දහස් අටසිය හැටහයයි ශත පහළොවක්) මත වසරකට සියයට පහළොවයි දශම පහයි බිංදුවක් (15.50%) බැගින් 2023.10.28 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, 2 වන ණය මත 2023.10.27 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 961,083.60 ක (රුපියල් නව ලක්ෂ හැට එක් දහස් අසූතුනයි ශත හැටක්) මුදලක් සමග රු. 590,745.23 (රුපියල් පන්ලක්ෂ අනූ දහස් හත්සිය හතළිස් පහයි ශත විසිතුනක්) මත වසරකට සියයට විසිපහයි දශම දෙකයි පහක් (25.25%) බැගින් 2023.10.28 දින සිට විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය ද ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3, ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර M. H. T. කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළකිරීමට ලංකා බැංකුව, ගිරිඋල්ල ශාඛාවේ කළමනාකාර මහතා හට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙනි හත්පත්තුවේ, උඩුකහ කෝරළේ, බටහිර නාරම්මල ප්‍රාදේශීය සභා සීමාවේ සහ නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිලිගල - අංක 1040 දරන ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ, රිලිගල හි පිහිටි "බංගලාවත්ත" නමැති ඉඩම බලයලත් මිනින්දෝරු ඇනස්ලි වී. ලියනගේ විසින් සාදන ලද 2008.12.18 දිනැති අංක 121 දරන පිඹුරේ ලොට් 1 ලෙස මායිම් නිරූපණය කර බෙදන ලද්දා වූ එකී ලොට් අංක 01, ඊසානටඃ ප්‍රාදේශීය සභා පාර ද, ගිනිකොණට : එකී පිඹුරේ ලොට් 2 සහ 3 ද, නිරිතදිගට : එෆ්. වී. පී. අංක 558 හි ලොට් 29 ද, වයඹටඃ බලයලත් මිනින්දෝරු එච්. ඩී. ජේ. අයි. මාර්ටිනස් විසින් සාදන ලද 2008.02.04 දිනැති අංක 5168 A දරන පිඹුරේ ලොට් 3 ද මායිම්ව පර්චස් විසිතුනයි දශම හතයි තුනක් (පර්. 23.73) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සමග එහි පිහිටි සියලු දේ සමග වේ. මෙම ඉඩම නාරම්මල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ T 86/126 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. ඒ. ඒ. සංජීව මයා,
කළමනාකරු.

ලංකා බැංකුව,
ගිරිඋල්ල ශාඛාව.

02-800

---

**ලංකා බැංකුව**

**1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන පනතින් හා 2000 අංක 54 දරන පනතින් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වන වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම**

2023.12.04 පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. එස්. පී. විජේවික්‍රම විසින් සහතික කරන ලද 2016.07.20 දිනැති අංක 1172 දරන උකස් බැඳුම්කරය අනුව ණය මත 2023.10.25 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 10,299,844.29 (රුපියල් එක්කෝටි දෙලක්ෂ අනූනව දහස් අටසිය හතළිස් හතරයි ශත විසිනවයක්) මුදලක් සමග රු. 6,916,933.54 ක (රුපියල් හැටනව ලක්ෂ දාසය දහස් නවසිය තිස්තුනයි ශත පනස්හතරක්) මත වසරකට සියයට දාහතරක් (14%) බැගින් 2023.10.26 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, වත්තල, අවරිවත්ත පාර, 1 වන පටුමග, කුරුඳුවත්ත, අංක 529/3 හි සිවම් කමලේෂ් මහතා වෙතින් අය විය යුතුව ඇත.

2. එකී 2016.07.20 දිනැති අංක 1172 දරන උකස් බැඳුම්කරය අනුව ණය මත රු. 10,299,844.29ක (රුපියල් එක්කෝටි දෙලක්ෂ අනූනව දහස් අටසිය හතළිස් හතරයි ශත විසිනවයක්) මුදලක් ද 2023.10.26 දින සිට විකිණීමේ දිනය තෙක් එකී පරිදි පොළිය ද ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3, M/s T&H ඔක්ෂන් හි වෙන්දේසිකාර M. H. T. කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, කටුනායක නිදහස් වෙළඳ කලාප ශාඛාවේ කළමනාකාර මහත්මිය හට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**පළමුවන උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අදිකාරි පත්තුවේ, කැලණිය ප්‍රාදේශීය සභා සීමාවේ, කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හුනුපිටිය දකුණ අංක 256A දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හුනුපිටිය ග්‍රාමයේ පිහිටි ඇවරිවත්ත පාර, 1 වන පටුමග, වරිපනම් අංක 39 දරන "කුරුඳුවත්ත සහ දවගහවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු අයි. එම්. සී. ප්‍රනාන්දු විසින් සාදන ලද 1998 ජනවාරි 26 දිනැති අංක 1583 දරන පිඹුරේ මායිම් නිරූපණය කර ලොට් 9A ලෙස ලකුණු කළ බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් 9A හි මායිම් නම්, උතුරට : අංක 954 දරන පිඹුරේ ලොට් අංක 5 සහ 6 ද, නැගෙනහිරට : ලොට් 9B ද, දකුණට : අංක 826 දරන පිඹුරේ ලොට් 15 (අඩි 10ක් පළල පාර) ද, බස්නාහිරට : අංක 954 දරන පිඹුරේ ලොට් 18 සහ 8 ද මායිම්ව පර්චස් දහයයි දශම පහක් (පර්. 10.5) හෝ හෙක්ටෙයාර 0.0266ක බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම සමග එහි පිහිටි ගහකොළ, වැවිලි සහ සියලු දේ සමග වේ.

එකී අංක 1583 දරන පිඹුරේ මායිම් නිරූපණය කළ එකී ලොට් 9A පහත සඳහන් ඉඩමේ නැවත මිනුමකි.

එකී හුනුපිටිය ග්‍රාමයේ පිහිටි ඇවරිවත්ත පාර, 1 වන පටුමග, වරිපනම් අංක 37/1 දරන "කුරුඳුවත්ත සහ දවටගහවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඊ. ඩී. ඕ. කොරෙයා විසින් සාදන ලද 1992 මාර්තු 28 සහ 1992 අප්‍රේල් 02 දිනැති අංක 1219 දරන පිඹුරේ මායිම් නිරූපණය කර ලොට් 9A ලෙස ලකුණු කළ බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් 9A හි මායිම් නම්, උතුරට : අංක 954 දරන පිඹුරේ ලොට් අංක 5 සහ 6 ද, නැගෙනහිරට : ලොට් 9B ද, දකුණටඃ අංක 826 දරන පිඹුරේ ලොට් 15 (අඩි 10ක් පළල පාර) ද, බස්නාහිරටඃ

අංක 954 දරන පිඹුරේ ලොට් 18 සහ 8 ද මායිම්ව පර්චස් දහයයි දශම පහක (පර්. 10.5) හෝ හෙක්ටෙයාර 0.0266ක බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම සමග එහි පිහිටි ගහකොළ, වැව්ලි සහ සියලු දේ සමග වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ G 120/46 හි ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

1. එකී හුනුපිටිය ග්‍රාමයේ පිහිටි "කුරුඳුවත්ත සහ දවට-ගහවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු සී. ඩී. එස්. ගුණතිලක විසින් සාදන ලද 1981 මැයි 25 දිනැති අංක 826 දරන පිඹුරේ මායිම් නිරූපණය කර ලොට් 15 ලෙස ලකුණු කළ බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් 15හි මායිම් නම්, උතුරට ඃ පාර ද, නැගෙනනහිරට ඃ අංක 1454 දරන පිඹුරේ ලොට් CE1, E2 සහ D2 ද, දකුණට ඃ පාර ද, බස්නාහිරටඃ ලොට් 14, 13, 12 සහ 11 ද මායිම්ව පර්චස් අටයි දශම හතයි පහක් (පර්. 8.75) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 593/202 හි ලියාපදිංචි කර ඇත.

2. එකී හුනුපිය ග්‍රාමයේ පිහිටි "කුරුඳුවත්ත සහ දවටගහවත්ත" නමැති ඉඩම අංක 826 දරන පිඹුරේ මායිම් නිරූපණය කර ලොට් 16 ලෙස ලකුණු කළ බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් 16 හි මායිම් නම්, උතුරට ඃ ලොට් 8, 9 සහ 10 ද, නැගෙනහිට ඃ ලොට් 10 ද, දකුණට ඃ පාර ද, බස්නාහිරට ඃ පාර ද මායිම්ව පර්චස් එකයි දශම දෙකයි පහක් (පර්. 1.25) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිචි කිරීමේ කාර්යාලයේ C 593/201හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. ඒ. එන්. ආර්. ගුණරත්න මිය,
කළමනාකාරිණි.

ලංකා බැංකුව,
නිදහස් වෙළඳ කලාප ශාඛාව.
කටුනායක.

02-801

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන පනතින් හා 2000 අංක 54 දරන පනතින් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වන වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2023.12.18 දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. ඒ. කේ. අබේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2022.09.21 දිනැති අංක 1398 දරන උකස් බැඳුම්කරය මත ස්ථිර අයිරාව මත 2023.10.09 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 21,050,308.21ක (රු. දෙකෝටි දසලක්ෂ පනස් දහස් තුන්සිය අටයි ශත විසිඑකක්) මුදලක් සමග රු. 19,000,000.00ක (රු. එක් කෝටි අනූ ලක්ෂයක්) මත වසරකට සියයට විසිහයයි දශම දෙකයි පහක් (26.25%) බැගින් 2023.10.10 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, කිරිබත්ගොඩ, නුවර පාර, අංක 398/1 හි පිහිටි සීමාසහිත ස්මැක් සේරා පුද්ගලික සමාගමෙන් (අධ්‍යක්ෂවරු, කිරිබත්ගොඩ, නුවර පාර, අංක 398/1 හි 1. රත්නගොඩ බරනඩුගේ සංජීව පුෂ්පකුමාර ප්‍රියා චන්ද්‍රසිරි මහතා, 2. දහනායකගේ අරුණාවතී මහත්මිය සහ කොළඹ 10, මරදාන, ආනන්ද වීදිය, අංක 14/5 හි හිරන්යා රුවිනි හේරත් වෛද්‍යරත්න මහත්මිය) අය විය යුතුව ඇත.

2. එකී 2022.09.21 දිනැති අංක 1398 දරන උකස් බැඳුම්කරය අනුව ස්ථිර අයිරාව මත රු. 21,050,308.21ක (රු. දෙකෝටි දසලක්ෂ පනස් දහස් තුන්සිය අටයි ශත විසිඑකක්) මුදලක් ද 2023.10.10 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී පරිදි පොළිය ද ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3, M/s T&H ඔක්ෂන් හි වෙන්දේසිකාර M. H. T. කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ කිරිබත්ගොඩ අධි ශ්‍රේණි ශාඛාවේ, ජ්‍යෙෂ්ඨ කළමනාකාර මහත්මිය හට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අදිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාවේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පහල කරගහමුණ උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 249හි පහල කරගහමුණ ග්‍රාමයේ පිහිටි ශ්‍රී දේවානන්ද මාවත, වරිපනම් අංක 01 දරන "බෙලිගහවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු වී. ජී. විතාන විසින් සාදන ලද 2022.03.02 දිනැති අංක 302/2022 දරන පිඹුරේ ලොට් 3B1 ලෙස ලකුණු කර මායිම් නිරූපණය කළ බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් 3B1 හි මායිම් නම්, උතුරට ඃ සුසන්ත හේරත් විජයරත්නගේ ඉඩම ද, නැගෙනහිරට ඃ සුනිල් හේරත් විජේරත්නගේ ඉඩම ද, දකුණට ඃ දේවානන්ද මාවත ද, බස්නාහිරට ඃ සුනිල් හේරත් විජයරත්නගේ ඉඩම ද මායිම්ව එකී අංක 302/2022 දරන පිඹුර අනුව පර්චස් විසිපහයි දශම දෙකයි හයක් (පර්.25.26) බිම් ප්‍රමාණයකින් යුත්

ඉඩම සමග එහි පිහිටි පස්, ගොඩනැගිලි, ගහකොළ, වැවිලි ඇතුළු සියලු දේ සමග වේ.

එකී ලොට් 3B1 පහත විස්තර කළ ඉඩමේ නැවත මිනුමකි.

එකී පහල කරගහමුණ ග්‍රාමයේ පිහිටි "මිල්ල ගහවත්ත සහ බෙලිගහවත්ත (අනතුරුව බෙල්ගහවත්ත යනුවෙන් ලියාපදිංචි කර ඇති)" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. බී. එල්. ප්‍රනාන්දු විසින් සාදන ලද 2006 දෙසැම්බර් 13 දිනැති අංක 7341 දරන පිඹුරේ ලොට් 3B ලෙස ලකුණු කර මායිම් නිරූපණය කළ බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් 3B හි මායිම් නම්, උතුරට : අංක 8709 දරන පිඹුරේ ලොට් 2 ද, නැගෙනහිරට : අංක 5451 දරන පිඹුරේ ලොට් 4A ද, දකුණට: දේවානන්ද මාවත ද, බස්නාහිරට : අංක 7480 දරන පිඹුරේ ලොට් 3A ද මායිම්ව එකී අංක 7341 දරන පිඹුර අනුව පර්චස් විසිපහයි දශම පහයි බිංදුවක් (පර්. 25.50) බිම් ප්‍රමාණයකින් යුත් ඉඩම සමග එහි පිහිටි පස්, ගොඩනැගිලි, ගහකොළ, වැවිලි ඇතුලු සියලු දේ සමග වේ. මෙම ඉඩම මහර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M151/137හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජේ. ඩී. හෙට්ටිආරච්චි මිය,
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
කිරිබත්ගොඩ.

02-802

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන පනතින් හා 2000 අංක 54 දරන පනතින් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වන වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2023.12.18 පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. ඒ. කේ. අබේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2022.09.21 දිනැති අංක 1397 දරන උකස් බැඳුම්කරය අනුව ස්ථිර අයිරා මත 2023.10.09 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 28,805,684.93ක (රුපියල් දෙකෝටි අසූඅටලක්ෂ පන් දහස් හයසිය අසූහතරයි ශත අනූතුනක්) මුදලක් සමග රු. 26,000,000.00ක (රුපියල් දෙකෝටි හැට ලක්ෂයක්) මත වසරකට සියයට විසිහයයි දශම හතයි පහක් (26.75%) බැගින් 2023.10.10 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, කිරිබත්ගොඩ, නුවර පාර, අංක 398/1 හි පිහිටි සීමාසහිත ස්මැක් සේරා ඉන්ටනැෂනල් පුද්ගලික සමාගමෙන් අය විය යුතුව ඇත.

2. එකී 2022.09.21 දිනැති අංක 1397 දරන උකස් බැඳුම්කරය අනුව ස්ථිර අයිරා මත රු. 28,805,684.93ක (රුපියල් දෙකෝටි අසූඅටලක්ෂ පන් දහස් හයසිය අසූහතරයි ශත අනූතුනක්) මුදලක් ද 2023.10.10 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී පරිදි පොළිය ද ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3, M/s T&H ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ කිරිබත්ගොඩ අධි ශ්‍රේණි ශාඛාවේ, ජ්‍යෙෂ්ඨ කළමනාකාර මහත්මිය හට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අදිකාරි පත්තුවේ, කැලණිය ප්‍රාදේශීය සභා සීමාවේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තලවතුහේන්පිට උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 267 හි තලවතුහේන්පිට උතුර ග්‍රාමයේ පිහිටි සිරිමා බණ්ඩාරනායක මාවත, වරිපනම් අංක 024/47 දරන "වලව්වත්ත සහ බෙලිගහවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ආර්. එම්. ප්‍රනාන්දු විසින් සාදන ලද 2016.02.07 දිනැති අංක 148/2016 දරන පිඹුරේ ලොට් 1 ලෙස ලකුණු කර මායිම් නිරූපණය කළ බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් 1හි මායිම් නම්, උතුරට : පාර සහ කේ. බී. ඒ. පෙරේරා හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : සේනානායක හිමිකම් කියන ඉඩම ද, දකුණට: විවේකාරාමය පන්සලේ පරිශ්‍රය ද, බස්නාහිරට : ඩී. එම්. ආර්. දිසානායක හිමිකම් කියන ඉඩම සහ විවේකාරාමය පන්සලේ පරිශ්‍රය ද මායිම්ව එකී අංක 148/2016 දරන පිඹුර අනුව පර්චස් තිස්එකක් (පර්. 31) බිම් ප්‍රමාණයකින් යුත් ඉඩම සමග එහි පිහිටි පස්, ගොඩනැගිලි, ගහකොල, වැවිලි ඇතුළු සියලු දේ සමග වේ. මෙම ඉඩම මහර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 156/29 හි ලියාපදිංචි කර ඇත.

තව ද, (සිරිමල් බණ්ඩාරනායක මාවත 1 වන පටුමග යනුවෙන් හඳුන්වන) සිරිමා බණ්ඩාරනායක මාවතේ සිට

නිවාසවලට යන පොදු පාර දිගේ සහ පාර මත මාර්ග අයිතිය ද වේ.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජේ. ඩී. හෙට්ටිආරච්චි මිය,
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණි.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
කිරිබත්ගොඩ.

02-804

---

## කාර්ගිල්ස් බෑන්ක් පී. එල්. සී. (පෙර කාර්ගිල්ස් බෑන්ක් ලිමිටඩ්)

### 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගණුදෙනුකරුගේ නම :- අජන්ත නිරෝෂන් පාදුක්ක

ලියාපදිංචි අංක PQ00293614 දරන කාර්ගිල්ස් බෑන්ක් පීඑල්සී (ලියාපදිංචි අංක PB 4847 දරන කාර්ගිල්ස් බෑන්ක් ලිමිටඩ් ලෙස පෙර හැඳින් වූ) හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024.01.30 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම්, අජන්ත නිරෝෂන් පාදුක්ක බන්ධනදායී වශයෙන් කොළඹ 3, ගාලු පාර, අංක 696 හි ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටි ලියාපදිංචි අංක PB 4847 දරන කාර්ගිල්ස් බෑන්ක් ලිමිටඩ් (මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) නමට ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. එස්. පී. කේ. සුබසිංහ විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2022.07.02 දිනැති අංක 768 අංක 770 දරන උකස් බැඳුම්කර මගින් මෙහි පහත උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය උකස් කොට බැඳ තබා ප්‍රදානය කරන ලද ණය පහසුකම මත ගෙවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී අංක 768 සහ 770 දරන උකස් බැඳුම්කර මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් 2023.10.09 දින දක්වා මුල් මුදල සහ පොළිය, වශයෙන් රුපියල් විසි කෝටි අනූහතර ලක්ෂ හැත්තෑ නව දහස් එකසිය අනූතුනයි ශත හතක ( රු. 209,479,193.07) මුදලක් සහ එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරනු ලබන තෙක් 2023.10.10 දින සිට රු. 184,117,968.10ක මුදල මත වර්ෂයකට 18.67%ක පොළියක් ද, බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

සහ

වර්ෂ 2023.10.09 දින දක්වා මුල් මදල සහ පොළිය, වශයෙන් රුපියල් දෙකෝටි පනස්හත් ලක්ෂ විසිදහස් දෙසිය විසිනවයයි ශත පනහක (රු. 25,720,229.50) මුදලක් සහ එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරනු ලබන තෙක් 2023.10.10 දින සිට රු. 24,818,891.40 ක මුදල මත වර්ෂයකට 6%ක පොළියක් ද බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ.

ඒ කෙසේ ද යත්,

එකී 768 සහ 770 දරන උකස්කර යටතේ අයවිය යුතු එකී රුපියල් විසිතුන් කෝටි පනස්එක් ලක්ෂ අනූනව දහස් හාරසිය විසිදෙකයි ශත දොළහක (රු. 235,199,422.12) මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළියක් ද, ගාස්තු ද වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද (ඒ වන විට යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල් අඩු කොට) අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත අජන්ත නිරෝෂන් පාදුක්ක බන්ධනදායී වශයෙන් උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවතේ, අංක 182/3 (50/3) දරන ස්ථානයනහි පදිංචි බලයලත් වෙන්දේසිකරු තුසිත් කරුණාරත්න වෙත වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තු, සල්පිටි කෝරළේ, කැස්බෑව නගර සභා සීමාව ඇතුළත, සුවාරපොල නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සුවාරපොල පිහිටි එහි පිහිටි ගොඩනැගිලි, පස, ගහකොළ, පලතුරු සහ සියලු දේ සමග වන මොරටුව පාරේ, වරිපනම් අංක 129, 129/3, 129/4, 129/4ඒ සහ 129/5 දරන "දවටගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. එල්. ද සිල්වා විසින් සාදන ලද වර්ෂ 1947 ක් වූ නොවැම්බර් මස 16 වැනි දිනැති අංක 1001/ඒ දරන පිඹුරේ ලොට් B1 සහ බලයලත් මිනින්දෝරු ටී. ඒ. බූරා විසින් සාදන ලද වර්ෂ 1965 ක් වූ සැප්තැම්බර් මස 15 වැනි දිනැති අංක 105 දරන පිඹුරේ දැක්වෙන (නැවත බෙදා මැනීමක, වඩාත් නිවැරදි ලෙස) (අංක 3066 දරන පිඹුරේ ලොට් 4ඒ, 4බී සහ 4සී ලෙස දැක්වෙන) ලොට් 1 (කොටස) 3 සහ 4, බලයලත් මිනින්දෝරු එන්. ඒ. ඊ. ජේ. සිල්වා විසින් සාදන ලද වර්ෂ 1992 ක් වූ

සැප්තැම්බර් මස 20 වැනි දිනැති අංක 577 දරන පිඹුරේ නැවත බෙදා වෙන් කර ඒකාබද්ධ ලොට් 1 ලෙස දක්වෙන) බලයලත් මිනින්දෝරු දිල්රුක් එන්. වෙදගේ විසින් සාදන ලද වර්ෂ 2021 ක් වූ ජූලි මස 05 වැනි දිනැති අංක 1563 දරන පිඹුරේ ලොට් එම් සලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල, එකී ලොට් එම් කැබැල්ලට මායිම්,

*උතුරට* : මොරටුව මාර්ගය, අඩි 8ක් පළල මාර්ගය සහ අංක 3119 දරන පිඹුරේ ලොට් 1, 2, 3, 4 සහ 5 ද;

*නැගෙනහිරට* : අඩි 8ක් පළල මාර්ගය සහ සෙන්ට්‍රල් කොලෙජ් පරිශ්‍රය ද;

*දකුණට* : අංක 1001ඒ දරන පිඹුරේ ලොට් ඒ1 ද;

*බස්නාහිරට* : අඩි 4-5 පළල අඩි පාර සහ මොරටුව මාර්ගය ද;

වන එකී අංක 1563 දරන පිඹුර ප්‍රකාරව, ප්‍රමාණයෙන් රූඩ් දෙකයි, පර්චස් හතරයි දශම දෙකයි පහක් (රූ.2, පර්.4 .25) (හෙක්ටෙයාර් 0.2131ක්) වන ඉඩම.

ඉහත ඉඩම පහත සඳහන් කොටස් නැවත මැන ඒකාබද්ධ කරන ලද්දකි.

(1) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තු, සල්පිටි කෝරළේ, කැස්බෑව නගර සභා සීමාව ඇතුළත, සුවාරපොල නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තුම්බෝවිල, සුවාරපොල පිහිටි, එහි පිහිටි ගොඩනැගිලි, පස, ගහකොළ, පලතුරු සහ සියලු දේද සමග වන මොරටුව පාරේ, වරිපනම් අංක 129 දරන "දවටගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. ඒ. ඊ. ජේ. සිල්වා විසින් සාදන ලද වර්ෂ 1992 ක් වූ සැප්තැම්බර් මස 20 වැනි දිනැති අංක 577 දරන පිඹුරේ ලොට් 1 සලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල, එකී ලොට් 1ට මායම් :

*උතුරට* : අඩි 8ක් පළල මාර්ගය ද;

*නැගෙනහිරට* : මූලිකව ඩබ්ලිව්. කේ. සිරියාවතී විසින් හිමිකම් පාන ලද දවටගහවත්ත ද;

*දකුණට* : අඩි පාර ද;

*බස්නාහිරට* : පිළියන්දල සිට මොරටුව දෙසට වන මාර්ගය ද;

වන එකී අංක 577 දරන පිඹුර ප්‍රකාරව, ප්‍රමාණයෙන් පර්චස් දහහතරයි දශම හතරයි හතක් (පර්. 14.47) (හෙක්ටෙයාර් 0.03660ක්) වන වෙළුම/පත්‍රිරුව සී 1189/15 යටතේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇති ඉඩම.

(2) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තු, සල්පිටි කෝරළේ, කැස්බෑව නගර සභා සීමාව ඇතුළත, සුවාරපොල නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සුවාරපොල පිහිටි, එහි පිහිටි ගොඩනැගිලි, පස, ගහකොළ, පලතුරු සහ සියලු දේද සමග වන මොරටුව පාරේ, වරිපනම් අංක 129/3 දරන "දවටගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ඒ. බූරා විසින් සාදන ලද වර්ෂ 1965 ක්වූ සැප්තැම්බර් මස 15 වැනි දිනැති අංක 105 දරන පිඹුරේ ලොට් 3 සලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල, එකී ලොට් 3ට මායම් :

*උතුරට* : ලොට් 2 ද;

*නැගෙනහිරට* : පිළියන්දල සෙන්ට්‍රල් කොලෙජ් පරිශ්‍රය ද;

*දකුණට* : මෙහි ම ලොට් 4 ද;

*බස්නාහිරට* : මෙහි ම ලොට් 1 (අඩි 8ක් පළල මාර්ගය) ද;

වන එකී අංක 105 දරන පිඹුර ප්‍රකාරව, ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දෙකයි දශම හතයි හයක් (රූ.1, පර්. 2.76)ක් වන වෙළුම/පත්‍රිරුව සී 1189/20 යටතේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇති ඉඩම.

(3) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තු, සල්පිටි කෝරළේ, කැස්බෑව නගර සභා සීමාව ඇතුළත, සුවාරපොල නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සුවාරපොල ග්‍රාමයේ පිහිටි, එහි පිහිටි ගොඩනැගිලි, පස, ගහකොළ, පලතුරු සහ සියලු දේද සමග වන මොරටුව පාරේ, වරිපනම් අංක 129/4 දරන "දවටගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඒ. කේ. ජේ. පෙරේරා විසින් සාදන ලද වර්ෂ 2000 ක්වූ දෙසැම්බර් මස 19 වැනි දිනැති අංක 3066 දරන පිඹුරේ ලොට් 4බී සලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල, එකී ලොට් 4බී ට මායිම් :

*උතුරට* : ලොට් 4ඒ ද;

*නැගෙනහිරට* : ලොට් 4සී ද;

*දකුණට* : ආර්. එම්. ඇග්නස් පෙරේරාගේ දවටගහවත්ත ද;

*බස්නාහිරට* : අඩි 3ක් පළල දෙවට ද;

වන එකී අංක 3066 දරන පිඹුර ප්‍රකාරව, ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම නවයයි බිංදුව (පර්. 7.90) (හෙක්ටෙයාර් 0.01972ක්) වන වෙළුම/පත්‍රිරුව සී 1189/17 යටතේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇති ඉඩම.

(4) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තු, සල්පිටි කෝරළේ, කැස්බෑව නගර සභා සීමාව ඇතුළත, සුවාරපොල නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සුවාරපොල ග්‍රාමයේ පිහිටි, එහි පිහිටි ගොඩනැගිලි, පස, ගහකොළ, පලතුරු සහ සියලු දේද සමග වන මොරටුව පාරේ, වරිපනම් අංක 129/4ඒ දරන "දවටගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඒ. කේ. ජේ. පෙරේරා විසින් සාදන ලද වර්ෂ 2000 ක්වූ දෙසැම්බර් මස 19 වැනි දිනැති අංක 3066 දරන පිඹුරේ ලොට් 4සී සලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල, එකී ලොට් 4සී ට මායිම් :

*උතුරට* : අංක 105 දරන පිඹුරේ ලොට් 3 ද;

*නැගෙනහිරට* : පිළියන්දල සෙන්ට්‍රල් කොලෙජ් පරිශ්‍රය ද;

*දකුණට* : ආර්. එම්. ඇග්නස් පෙරේරාගේ දවටගහවත්ත ද;

*බස්නාහිරට* : මෙහි ලොට් 4ඒ සහ ලොට් 4බී ද;

වන එකී අංක 3066 දරන පිඹුර ප්‍රකාරව, ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම නවයයි බිංදුව (පර්. 7.90) (හෙක්ටෙයාර් 0.01972ක්) වන වෙළුම/පත්‍රිරුව සී 1189/19 යටතේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇති ඉඩම.

(5) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තු, සල්පිටි කෝරළේ, කැස්බෑව නගර සභා සීමාව ඇතුළත, සුවාරපොල නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සුවාරපොල ග්‍රාමයේ පිහිටි, එහි පිහිටි ගොඩනැගිලි, පස, ගහකොළ, පලතුරු සහ සියලු දේද සමග වන මොරටුව පාරේ, වරිපනම් අංක 129/5 දරන "දවටගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු දිල්රුක් එන්. වෙදගේ විසින් සාදන ලද වර්ෂ 2021 ක්වූ ජූලි මස 25 සහ 28 වැනි දිනැති අංක 1716 දරන පිඹුරේ ලොට් කේ සලකුණු කර ඇති (බලයලත් මිනින්දෝරු එන්. ඒ. ර්. ජේ. සිල්වා විසින් සාදන ලද වර්ෂ 1992 ක් වූ සැප්තැම්බර් මස 20 වැනි දිනැති අංක 577 දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කළ ලොට් 2 කැබැල්ලෙහි කොටසක් සහ තව ද බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. අයි. ද සිල්වා විසින් සාදන ලද වර්ෂ 1947 ක් වූ නොවැම්බර් මස 16 වැනි දිනැති අංක 1001ඒ දරන පිඹුරේ බී1 හි නැවත මැනීමක්) බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල. එකී ලොට් කේ කැබැල්ලට මායිම් :

*උතුරට* : බලයලත් මිනින්දෝරු ඩී. එන්. වෙදගේ විසින් සාදන ලද වර්ෂ 2022 ක් වූ ජනවාරි මස 10 වැනි දිනැති අංක 1563 දරන පිඹුරේ ලොට් එම් දරන කැබැල්ලහි ඉතිරි කොටස ද;

*නැගෙනහිරට* : පිළියන්දල සෙන්ට්‍රල් කොලෙජ් පරිශ්‍රය ද;

*දකුණට* : බලයලත් මිනින්දෝරු ඩී. එන්. වෙදගේ විසින් සාදන ලද වර්ෂ 2021 ක් වූ මැයි මස 04 වැනි දිනැති අංක 1665 දරන පිඹුරේ ලොට් එන් කැබැල්ල ද;

*බස්නාහිරට* : අඩි 4-5ක් පළල අඩි පාර ද;

වන එකී අංක 1716 දරන පිඹුර ප්‍රකාරව, ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම අටයි දෙකක් (පර්. 11.82) (හෙක්ටෙයාර් 0.0299ක්) වන වෙළුම/පත්‍රිරුව සී 1189/16 යටතේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇති ඉඩම.

ඉහත ලොට් කේ කැබැල්ල, බලයලත් මිනින්දෝරු එන්. ඒ. ර්. ජේ. සිල්වා විසින් සාදන ලද වර්ෂ 1992 ක් වූ සැප්තැම්බර් මස 20 වැනි දිනැති අංක 577 දරන පිඹුරේ නිරූපිත ලොට් 2හි බෙදා වෙන්කරන ලද කොටසක් ද බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. එල්. ද සිල්වා විසින් සාදන ලද වර්ෂ 1947 ක් වූ නොවැම්බර් මස 16 වැනි දිනැති අංක 1001ඒ දරන පිඹුරේ නිරූපිත බී1 කැබැල්ලහි නැවත මැනීමක් සහ අංක 1716 දරන පිඹුරේ ප්‍රධාන ඉඩම වන එකී ලොට් කේ මෙහි සවිස්තරව විස්තර කරනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තු, සල්පිටි කෝරළේ, කැස්බෑව නගර සභා සීමාව ඇතුළත, සුවාරපොල නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තුම්බෝවිල, සුවාරපොල පිහිටි, එහි පිහිටි ගොඩනැගිලි, පස, ගහකොළ, පලතුරු සහ සියලු දේද සමග වන "දවටගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. ඒ. ර්. ජේ. සිල්වා විසින් සාදන ලද වර්ෂ 1992 ක් වූ

සැප්තැම්බර් මස 20 වැනි දිනැති අංක 577 දරන පිඹුරේ ලොට් 2 සලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල. එකී ලොට් 2 ට මායිම් :

*උතුරට* : ඩබ්ලිව්. කේ. සිරියාවතී විසින් හිමිකම් පාන ලද දවටගහවත්ත ද;

*නැගෙනහිරට* : පිළියන්දල සෙන්ට්‍රල් කොලෙජ් පරිශ්‍රය ද;

*දකුණට* : අංක 1001 දරන පිඹුරේ ලොට් සී1 ද;

*බස්නාහිරට* : අඩි 4 ක් පළල අඩි පාර ද;

වන එකී අංක 577 දරන පිඹුර ප්‍රකාරව, ප්‍රමාණයෙන් පර්චස් දහනවයයි දශම එකයි එක (පර්. 19.11) (හෙක්ටෙයාර් 0.04833)ක් වන වෙළුම/පත්ඉරුව එම් 2085/190 යටතේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇති ඉඩම.

මෙහි පහත දැක්වෙන පරිදි ඒ මතින් සහ ඔස්සේ මාර්ග අයිතිවාසිකම ද සමග වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තු, සල්පිටි කෝරළේ, කැස්බෑව නගර සභා සීමාව ඇතුළත, සුවාරපොල නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සුවාරපොල ග්‍රාමයේ පිහිටි "දවටගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ඒ. බූරා විසින් සාදන ලද වර්ෂ 1965 ක් වූ සැප්තැම්බර් මස 15 වැනි දිනැති අංක 105 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 (අඩි 8 පළල) සලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල, එකී ලොට් 1ට මායිම්,

*උතුරට* : දවටගහවත්ත මොරටුව පාරේ, වරිපනම් අංක 111, 115, 115/1 දරන ස්ථානය ද;

*නැගෙනහිරට* : ලොට් 2 සහ 3 ද;

*දකුණට* : මෙහි ම ලොට් 4 ද;

*බස්නාහිරට* : අඩි 3 1/2ක් පළල දෙවට පාර සහ දවටගහවත්ත මොරටුව පාරේ, වරිපනම් අංක 131 සහ 133 දරන ස්ථාන ද;

වන එකී අංක 105 දරන පිඹුර ප්‍රකාරව, ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම දෙකයි පහක් (පර්. 3.25ක්) වන වෙළුම/පත්ඉරුව සී 1106/23 සහ සී 1189/14 යටතේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇති ඉඩම.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තු, සල්පිටි කෝරළේ, කැස්බෑව නගර සභා සීමාව ඇතුළත, සුවාරපොල නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සුවාරපොල ග්‍රාමයේ පිහිටි "දවටගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඒ. කේ. ජේ. පෙරේරා විසින් සාදන ලද වර්ෂ 2000 ක් වූ දෙසැම්බර් මස 19 වැනි දිනැති අංක 3066 දරන පිඹුරේ නිරූපිත ලොට් 4ඒ සලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල, එකී ලොට් 4ඒ ට මායිම්,

*උතුරට* : අංක 105 දරන පිඹුරේ ලොට් 1 (අඩි 8 මාර්ගය) සහ ලොට් 3 ද;

*නැගෙනහිරට* : ලොට් 4සී ද;

*දකුණට* : ලොට් 4බී ද;

*බස්නාහිරට* : අඩි 3ක් පළල දෙවට ද;

වන එකී අංක 3066 දරන පිඹුර ප්‍රකාරව, ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම නවයයි තුනක් (පර්. 3.93) (හෙක්ටෙයාර් 0.00994ක්) වන වෙළුම/පත්ඉරුව සී 1189/18 යටතේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇති ඉඩම. සහ අඩි 4ක් පළල මාර්ගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

චමිලා අබේසූරිය,
අංශ ප්‍රධානි - අයකර ගැනීම්.

02-805

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.